දකුණු පළාතේ ආණ්ඩුකාර
...ය
1990 ...27
ගාල්ල.

දකුණු පළාත් සභා ලේකම් කාර්යාලය
29 -11- 1990
ගාල්ල

1990 අංක 03 දරණ

# මුදල් ප්‍රඥප්තිය

1990 අංක...3 දරණ මුදල් ප්‍රඥප්තිය

දකුණු පළාත් සභාව.

## 1990 අංක 3 දරන මුදල් ප්‍රඥප්තිය

ඇතැම් බදු, බලපත්‍ර ගාස්තු, තීරු ගාස්තු සහ කලින් පැනවීම සහ එකතු කිරීම සඳහා, පළාත තුළ පිහිටි අධිකරණ විසින් පනවනු ලබන දඩ මුදල් පළාතේ ආදායමට උපචිත කිරීම සඳහා සහ ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධි විධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

මේ ප්‍රඥප්තිය පහත දැක්වෙන ගාස්තු වලට අනනුකූල වේ:-

(1) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත
(2) ඔට්ටු ඇල්ලීම සහ තුරඟ තරඟ පිළිබඳ ආඥා පනත
(3) ලොතරැයි ආඥා පනත
(4) තෑගි එකතු කිරීමේ පනත
(5) සුරාබදු ආඥා පනත
(6) මෝටර් රථ ප්‍රවාහණ පනත
(7) මෝටර් වාහන ආඥා පනත
(8) වනසත්ව සහ වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනත
(9) රජයේ ඉඩම් ආඥා පනත
(10) ඉඩම් සංවර්ධන ආඥා පනත
(11) 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ ප්‍රඥප්තිය දකුණු පළාතේ 1990 අංක 3 දරන මුදල් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර ආණ්ඩුකාරවරයාගේ අනුමතිය ලැබුණු දින සිට එය ක්‍රියාත්මක වන්නේය.

### 1 වන පරිච්ඡේදය

### තොග සහ සිල්ලර වෙළඳාම මත පිරිවැටුම් බදු පැනවීම

තොග සහ සිල්ලර වෙළඳ බදු.

2. (1) 19:1 ජනවාරි 1 වන දිනෙන් ආරම්භ වන සහ ඊට

පසුව එළඹෙන එක් එක් කාර්තුව සඳහා, පළාත තුළ තොග හෝ සිල්ලර වෙළඳ ව්‍යාපාරය කර ගෙන යන සෑම තැනැත්තකු විසින් තම ව්‍යාපාරයෙන් ලබන පිරිවැටුම් සම්බන්ධයෙන් වූ බද්දක් (මෙහි මින් මතු "තොග සහ සිල්ලර වෙළඳ බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මඟින් නියම කරනු ලබන අනුප්‍රමාණ වලට අනුව ඒ එක් එක් තැනැත්තාගෙන් අය කරනු ලැබේ.

(2) තොග සහ සිල්ලර වෙළඳ බද්දේ අනුප්‍රමාණය ඒ ඒ තොග සහ සිල්ලර වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවයට අනුව නිර්ණය කරනු ලැබිය හැකි අතර තොග සහ සිල්ලර වෙළඳ ව්‍යාපාරවල ඒ ඒ පන්ති හෝ වර්ග සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලැබ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ඒ ඒ වෙනස් අනුප්‍රමාණවලට අනුව එකී බද්ද අය කරනු ලැබේ.

(3) යම් ව්‍යාපාර පන්තියක් හෝ වර්ගයක් සම්බන්ධයෙන් පනවා ඇති තොග සහ සිල්ලර වෙළඳ බද්දේ අනුප්‍රමාණය අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තදනන්තර නියමයන් මඟින් වෙනස් කරනු ලැබිය හැකිය.

(4) පළාතේ ආර්ථික ප්‍රගතිය සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා අදහස් කරන අවස්ථාවකදී අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මඟින් එහි නිශ්චිතව සඳහන් යම් පන්තියක හෝ වර්ගයක ව්‍යාපාරයක් එකී වෙළඳ බද්දෙන් නිදහස් කරනු ලැබිය හැකිය.

"පිරිවැටුම" යන්නෙහි අර්ථ කථනය.

3. (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා "පිරිවැටුම" යන්න යම් ව්‍යාපාරයකට අදාළව යෙදී ඇති විට, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඇතුළත් වන ගනුදෙනු වලින් ලැබෙන හෝ ලැබිය යුතු වන මුළු මුදල් ප්‍රමාණය ඉන් අදහස් වේ.

(2) යම් කාර්තුවකදී ලැබිය යුතු යම් මුදල් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ඒ කාර්තුව සඳහා වූ තොග සහ සිල්ලර වෙළඳ බද්ද ගෙවා ඇති අවස්ථාවකදී

එකී මුදල් ප්‍රමාණය ඇත්තවශයෙන්ම ලැබුණු කාර්තුව සම්බන්ධයෙන් වූ බද්දත් ඒ මුදල සඳහා ගෙවීමට අවශ්‍ය නොවේ.

4. (1) යම් කාර්තුවක් සඳහා වූ තොග සහ සිල්ලර වෙළඳ බද්ද නිශ්චය **කිරීමේ**, ඒ කාර්තුව තුළදී ඒ ව්‍යාපාරයේ බොල් ණයක් බවට පත් වී ඇත්තා වූද යම් යම් කාර්තුවක් සඳහා වූ තොග සහ සිල්ලර වෙළඳාම පිළිබඳ පිරිවැටුම් බද්දට ඇතුළත් කොට තිබුනා වූ සහ ඒ සඳහා වෙළඳ බද්ද ගෙවා ඇත්තා වූ ද, යම් බොල් ණයකට සමාන මුදල් ප්‍රමාණයක් අඩු කරනු ලැබිය යුතුය. එසේ වුවද බොල් ණයක් සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ කලින් අඩු කරන ලද මුදලක් ඒ ව්‍යාපාරයේ යම් කාර්තුවක් සඳහා ලැබුණු අවස්ථාවකදී ඒ මුදල ලැබුනේ යම් කාර්තුවකදීද ඒ කාර්තුවේ ව්‍යාපාරයේ පිරිවැටුම් බද්දට එය එකතු කරනු ලැබිය යුතුය.

(2) තොග සහ සිල්ලර වෙළඳ බදු කාර්ය සඳහා යම් ව්‍යාපාරයක පිරිවැටුම තීරණය කිරීමේදී –

(අ) යම් තැනැත්තකු විසින් එකම ස්ථානයේ හෝ වෙනස් වෙනස් ස්ථානවලදී එකම ස්වභාවයේ ව්‍යාපාරයක් කර ගෙන යන්නේ නම් ඒ ව්‍යාපාරය එක් ව්‍යාපාරයක් ලෙස ගණන් ගත යුතුය.

සහ

(ආ) එකම තැනැත්තා විසින් එකම ස්ථානයේදී විවිධ ව්‍යාපාර කර ගෙන යනු ලබන්නේ නම් එසේ එකම ව්‍යාපාරයක් ලෙස ගණන් ගනු ලැබිය යුතුය.

නිදහස් කැරෙන භාණ්ඩ.

5. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ නියමයේ නිශ්චිතව සඳහන් යම් භාණ්ඩයක් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා නිදහස් කරනු ලැබූ භාණ්ඩයක් ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

(2) යම් පන්තියක හෝ වර්ගයක ව්‍යාපාර, සම්බන්ධයෙන් යම් භාණ්ඩයක් නිදහස් කරනු ලැබූ භාණ්ඩයක් ලෙස ප්‍රකාශ කර ඇති විටක ඒ භාණ්ඩය විකිණීමෙන් උපලබ්ධ වන මුදල විෂයෙහි තොග හා සිල්ලර වෙළඳ බද්දක් අය නොකරනු ලැබිය යුතුය.

පිරිවැටුම රු: 25000/-ට වැඩි වන විට වාර්තා සැපයිය යුතු බව.

6. (1) පළාත තුළ කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයකින් යම් කාර්තුවකට ලැබෙන පිරිවැටුම රුපියල් විසිපන් දහසකට නොඅඩු වන්නාවූද ඒ ව්‍යාපාරය කර ගෙන යන යම් තැනැත්තකු විසින් ඒ ව්‍යාපාරය යම් කාර්තුවකින් කොටසකදී පමණක් කරගෙන ගොස් ඇත්තාවූද අවස්ථාවකදී ඒ කාර්තුවේ ඒ කොටස සඳහා ඒ ව්‍යාපාරයේ පිරිවැටුම සහ රුපියල් විසිපන්දහසක් අතර ඇති අනුපාතය ඒ කාර්තුවේ ඒ දින ගණන සහ දින අනුවක් අතර ඇති අනුපාතයට නොඅඩු වන්නේ නම් පළාත තුළ එවැනි ව්‍යාපාරයක් කරගෙන ගිය සෑම තැනැත්තකුම විසින්, අවස්ථාවෝචිත පරිදි ඒ කාර්තුව හෝ කාර්තුවේ ඒ කොටස හෝ ඉකුත් වී දින පහළොවක් ගතවීමට පෙර , ඒ ව්‍යාපාරයේ ඒ කාර්තුවේ නැතහොත් ඒ කාර්තුවේ කොටසේ පිරිවැටුම දැක්වෙන වාර්තාවක් කොමසාරිස්වරයා වෙත සැපයිය යුතුය. එවැනි සෑම වාර්තාවක්ම නියමිත ආකෘතියේ අනුසාරයෙන් සැපයිය යුතු අතර, ඒ ආකෘතියේ දැක්විය යුතු යයි නියමිත සියලු විස්තර ඒ ආකෘතියේ අඩංගු කළ යුතුය.

(2) යම් තැනැත්තකු තොග සහ සිල්ලර වෙළඳ බද්ද ගෙවිය යුතු තැනැත්තකු යයි තක්සේරුකරු විසින් නිගමනය කරනු ලැබූ විටක ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලබන ලිඛිත නිවේදනයක් මගින්, ඒ නිවේදනයේ නිශ්චිතව සඳහන් කාලය තුළදී තක්සේරුකරු විසින් නියම කරනු ලබන තොරතුරු ඇතුළත් වාර්තාවක් සපයන ලෙස තක්සේරුකරු විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය.

(3) යම් තැනැත්තකු විසින් කරගෙන යනු ලබන යම් ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුම සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු ලබා ගැනීමේ කාර්ය සඳහා තක්සේරුකරු විසින් ඒ තැනැත්තා වෙත පහත දැක්වෙන නියමයන් ඉටු කළ යුතු බවට ඒ තැනැත්තා විසින් ලිඛිත නිවේදනයක් යවනු ලැබිය හැකිය:-

(අ) ඒ නිවේදනයේ නිශ්චිතව දක්වා ඇත්තා වූද ඒ තැනැත්තාගේ සන්තකයේ ඇත්තා වූද, පොත්, ගිණුම්, වෙළඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර, චෙක්පත්, ගෙවීම් පත්‍රිකා, විගණකවරුන්ගේ වාර්තා හෝ වෙනත් ලේඛන ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කොට ඇති කාලපරිච්ඡේදය තුළදී පරීක්ෂා කිරීම සඳහා තක්සේරුකරු වෙත ඉදිරිපත් කිරීමට හෝ යැවීමට,

(ආ) ඒ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් ස්ථානයකදී, දිනයකදී සහ වේලාවකදී තමා ම පෞද්ගලිකව පැමිණිය යුතු බවට හෝ බලය දෙන ලද නියෝජිතයකු මගින් පෙනී සිටිය යුතු බවට.

(4) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පහත දැක්වෙන දෑ නියම කරමින් යම් තැනැත්තකු වෙත ලිඛිත දැන්වීමක් නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් යවනු ලැබිය හැකිය :-

(අ) ඒ නිවේදනයේ නිශ්චිතව දක්වා ඇත්තා වූද ඒ තැනැත්තාගේ සන්තකයේ ඇත්තා වූද, පොත්, ගිණුම්, වෙළඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර, චෙක්පත්, ගෙවීම් පත්‍රිකා, විගණකවරුන්ගේ වාර්තා හෝ වෙනත් ලේඛන ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කොට ඇති කාලපරිච්ඡේදය තුළදී පරීක්ෂා කිරීම සඳහා නියෝජ්‍ය කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීමට හෝ යැවීමට,

(ආ) ඒ දැන්වීමෙහි සඳහන් යම් කරුණක් හෝ කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කරනු ලැබීම සඳහා ඒ දැන්වීමේ සඳහන් ස්ථානයකදී, දිනයකදී සහ වේලාවකදී තමාම පෞද්ගලිකව පැමිණ සිටිය යුතු බවට හෝ බලය දෙන ලද නියෝජිතයකු මගින් පෙනී සිටිය යුතු බවට.

(5) ඉහත (4) වන උපවගන්තිය යටතේ කරන ලද දැන්වීමකට අවනත වෙමින් පැමිණෙන යම් තැනැත්තකු විසින් යුක්ති සහගත ලෙස දරනු ලැබූ වියදම් කොමසාරිස්වරයා විසින් ඔහුට ගෙවනු ලැබිය හැකිය.

(6) ඉහත (3) වන උපවගන්තිය හෝ (4) වන උප වගන්තිය යටතේ තමන් වෙත ඉදිරිපත් කරනු ලැබූ හෝ එවනු ලැබූ නැතහොත් වෙනත් යම් ආකාරයකින් තම සන්තකයට පත් වූ හෝ ලැබී තිබුණු පොත්, ගිණුම්, වෙළඳ ලැයිස්තු, තොග ලැයිස්තු, ලේඛන, වවුචර, චෙක්පත්, ගෙවීම් පත්‍රිකා, ව්‍යාපාරිකයන්ගේ වාර්තා හෝ වෙනත් ලේඛන තිබේනම් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා තබා ගැනීම අවශ්‍ය වන තාක් කල් නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයෙකුගේ අනුමැතිය යටතේ යම් තක්සේරුකරුවකු විසින් තමන් ඉදිරියේ රඳවා ගනු ලැබිය හැකිය.

(7) තක්සේරුකරු විසින් අවශ්‍ය යයි සිතනු ලැබූ විටක හෝ එසේ සිතනු ලබන ඕනෑම වාර ගණනකදී යම් තැනැත්තකු වෙත ලිඛිත දැන්වීමක් නිකුත් කරමින් ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලය තුළදී පහත දැක්වෙන දෑ ඉදිරිපත් කරන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය:-

(අ) වඩාත් සම්පූර්ණ හෝ වැඩිදුරටත් වූ වාර්තා සපයන ලෙස; හෝ

(ආ) ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්ද තක්සේරු කිරීම සඳහා අවශ්‍ය වන්නේ යයි හෝ අදාළ වන්නේ යයි

තක්සේරුකරු අදහස් කරන යම් කරුණකට අදාළ සම්පූර්ණ වූ හෝ වැඩිදුරටත් වූ තොරතුරු සපයන ලෙස;

(8) මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තකු වෙනුවෙන් සපයන ලදැයි සලකනු ලබන යම් වාර්තාවක්, ප්‍රකාශයක්, ආකෘති පත්‍රයක්, සම්බන්ධයෙන් ප්‍රතිවිරුද්ධ ඔප්පු කිරීමක් කරනු ලැබුවහොත් මිස, අවස්ථාවෝචිත පරිදි එය ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ බලය යටතේ හෝ සපයනු ලැබුවක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය. තවද එවැනි වාර්තාවක්, ප්‍රකාශයක් හෝ ආකෘති පත්‍රයක් අත්සන් කරන යම් තැනැත්තකු, එහි අඩංගු සියලු කරුණු සම්බන්ධයෙන් දැනීම ඇත්තකු ලෙස සලකනු ලැබිය යුතුය.

(9) තක්සේරුකරුවකු විසින් (2) වන උපවගන්තිය යටතේ දෙනු ලැබූ යම් දැන්වීමක අඩංගු නියමයක් අනුගමනය කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබුවහොත්, කොමසාරිස්වරයා විසින්, ලිඛිත දැන්වීමක් මගින් -

(අ) රුපියල් පනස් දහසකට නොවැඩි දඩයක් ඒ තැනැත්තාට පනවනු ලැබිය හැකිය ; සහ

(ආ) 1. එවැනි දඩයක් ගෙවීමට සහ

11. තක්සේරුකරු විසින් දෙනු ලැබූ දැන්වීමෙහි සඳහන් වාර්තා කොමසාරිස්වරයාගේ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලපරිච්ඡේදය තුළදී, සපයන ලෙස ,

ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය.

(10) එකී වාර්තාව සැපයීම පැහැර හරින ලද්දේ තම පාලනයට පරිබාහිරවූ පරිවේෂණ හේතුකොට ගෙන බවත්දඩය පැනවීමෙන් පසු තමන් විසින් ඒ වා ර්තාව සපයන ලද බවත් යම් තැනැත්තකු විසින් කොමසාරිස්වරයා සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලැ බුවහොත් මේ වගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත පනවනු ලැබූ යම් දඩයක් අඩු කිරීම හෝ කපා හැරීම කොමසාරිස්වරයා විසින් කරනු ලැබිය හැකිය.

...|8

11. යම් තැනැත්තකු වෙත (9) වන උපවගන්තිය යටතේ දඩයක් නියම කරනු ලැබූ විටක ඒ දැන්වීමට අදාළව මේ ප්‍රඥප්තියේ යම් වගන්තියක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් ඔහු පවරනු ලැබීමට ඒ තැනැත්තා යටත් නොවන්නේය.

## II වන පරිච්ඡේදය

## ලොතරැයි සහ තෑගි තරඟ බදු

ලොතරැයි සහ තෑගි තරඟ මත පනවන බදු

7. පළාත තුළ පවත්වා ගෙන යනු ලබන සෑම ලොතරැයියක් සහ තෑගි තරඟයක් සම්බන්ධයෙන් (මෙහි මින් මතු ලොතරැයි බද්ද සහ තෑගි තරඟ බද්ද යනුවෙන් සඳහන් කරනු ලබන) බද්දක් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් නියම කරනු ලබන අනුප්‍රමාණවලට අනුව අය කරනු ලැබිය යුතුය. "තෑගි තරඟය" යන්නෙන් ද්‍රව්‍යවලින්, මුදලින් හෝ සේවා වලින් තෑගි පිරිනමනු ලබන තරඟයක් අදහස් වන අතර ලොතරැයියක් ඊට ඇතුළත් නොවේ.

(1) ලොතරැයියක් හෝ තෑගි තරඟයක් පිහිටුවීමට හෝ පැවැත්වීමට අපේක්ෂා කරන සෑම තැනැත්තකු විසින්ම, ඒ සඳහා වූ විධි විධානවලට අනුකූල, තත් කාර්ය සඳහා බලපත්‍රයක් ලබාගත යුතුය.

(2) ලොතරැයියක් හෝ තෑගි තරඟයක් පිහිටුවීමට හෝ පැවැත්වීම සඳහා වූ බලපත්‍රයක්, තත් කාර්ය සඳහා සාදන ලද නියෝගවලට අනුකූලව පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයා විමසීමෙන් පසු අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකිය.

(3) ඉහත (1) වන උප වගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු වුවහොත් රුපියල් දහසක (රු. 1000/=) දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලයකට බරපතල වැඩ නොමැතිව බන්ධනාගාරගත කිරීමට ඒ තැනැත්තා යටත් වන්නේය.

බලපත්‍ර නොලත් ලොතරැයියක් හෝ තෑගි තරඟයක් පැවැත්වීම සඳහා යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීම වරදක් බව.

8. පළාත තුළ පිහිටුවනු ලැබූ හෝ පවත්වනු ලබන බලපත්‍ර නොලත් ලොතරැයියකට හෝ තෑගි තරඟයකට සම්බන්ධ යම් කාර්යයක් සඳහා යම් පරිශ්‍රයක් හෝ ස්ථානයක් පවත්වාගෙන යන හෝ පාවිච්චි කරන හෝ යම් පරිශ්‍රයක නැතහොත් ස්ථානයක එවැන්නක් පවත්වාගෙන යාම හෝ එවැන්නක් සඳහා යම් පරිශ්‍රයක් නැතහොත් ස්ථානයක් පාවිච්චි කිරීමට දැන ඇතම ඉඩ දෙන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේදී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබුවහොත් රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලයකට බරපතල වැඩ රහිත බන්ධනාගාරගත කිරීමකට ඒ තැනැත්තා යටත් වන්නේය.

නියමයන් යනාදිය සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු බව.

9.(1) 2 වන වගන්තියේ (1) (3) සහ (4) වන උපවගන්ති යටතේ කරනු ලැබූ නියමයක් සහ (2) වන උපවගන්තිය යටතේ කරනු ලබන තීරණයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබුවහොත් සහ ඒ නියමය හෝ තීරණය අනුමත කරන ලෙස යෝජනාවක් මඟින් කරනු ලබන ඉල්ලීමක් ඒ නියමය හෝ තීරණය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාසයක් ඇතුළතදී පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් සහ එසේ මාසයක් ඇතුළත පළාත් සභාවේ රැස්වීමක් නොපැවැත්වේ නම් තදනන්තරව පැවැත්වෙන ප්‍රථම රැස්වීමට ඉදිරිපත් කරනු ලැබ පළාත් සභාව විසින් එය අනුමත කරන ලද්දේ නම් මිස එවැනි නියමයක් හෝ තීරණයක් බලාත්මක නොවන්නේය.

(2) එවැනි නියමයක් හෝ තීරණයක පාඨය එවැනි සෑම යෝජනාවකට උපලේඛන ගත කොට තිබිය යුතුය.

ජාතික ලොතරැයි සහ ආණ්ඩුවේ ලොතරැයි නිදහස් කැරෙන බව.

10. යම් ජාතික ලොතරැයියක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සංවිධානය කරනු ලැබූ යම් ලොතරැයියක් සඳහා මේ පරිච්ඡේදයේ විධි විධාන හෝ මේ ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක විධි විධාන යටතේ සාදනු ලැබූ නියෝගයක් අදාළ නොවන්නේය.

## 111 වන පරිච්ඡේදය

## ඔට්ටු ඇල්ලීම මත පැනවෙන බදු

ඔට්ටු ඇල්ලීමට පැනවෙන බදු

11. (1) පළාත තුළ වුවද ඉන් පිටත වුවද පවත්වනු ලබන තුරඟ තරඟ සඳහා ඔට්ටු අල්ලනු ලබන තවර වුවද වර්ගයක ඔට්ටු මත (මෙහි මින් මතු ඔට්ටු ඇල්ලීමේ බද්ද යනුවෙන් සඳහන් කරනු ලබන) බද්දක් පනවා අය කරනු ලැබිය යුතුය.

(2) යම් තැනැත්තකු විසින් -

(අ) තුරඟ තරඟයකදී හෝ ඒ කාර්ය සඳහා උපයෝගී කර ගනු ලබන වෙනත් උපක්‍රමයක් නැතහොත් වෙනත් උපකරණයක් සම්බන්ධයෙන් ඔට්ටුවක් ගනු ලැබුවහොත් හෝ තබනු ලැබුවහොත් හෝ

(ආ) තුරඟ තරඟයකදී හෝ ඒ කාර්ය සඳහා වූ වෙනත් යම් උපක්‍රමයක් නැතහොත් උපකරණයක් මත යම් ඔට්ටුවක භාර ගනු ලැබුවහොත් හෝ ගනුදෙනු කරනු ලැබුවහොත්

ඒ ක්‍රියාත්මකව කර ගෙන ගිය ස්ථානය මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ලියා පදිංචි කළ යම් බලපත්‍ර ලත් ස්ථානයක් වන්නේ නම් මිස, ඒ තැනැත්තා නීති විරෝධීව ඔට්ටු අල්ලන්නකු ලෙස සලකනු ලැබිය යුතුය.

(3) මේ පරිච්ඡේදය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සහ බලපත්‍ර ලබාගනු ලැබූ පරිශ්‍රයක් වන්නේ නම් මිස යම් පරිශ්‍රයක අයිතිකරු හෝ එහි පදිංචිකරු විසින් ඒ පරිශ්‍රය ඔට්ටු ඇල්ලීමේ ස්ථානයක් ලෙස පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය. මේ වගන්තියේ (2) වන හෝ (3) වන උපවගන්තිවල විධි විධාන උල්ලංඝණය කරන හෝ ඒ විධි විධාන අනුගමනය කිරීම පැහැර හරින සෑම තැනැත්තකු, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු

විභාගයකදී වරදකරු කරනු ලැබූ විට රු: 1000/= කට නොවැඩි වූ දඩයකට හෝ මාස 6 කට නොවැඩි කාලයකට බරපතළ වැඩ රහිත බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ ඒ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතුය.

## IV වන පරිච්ඡේදය

### 1 වන කොටස

### අරක්කු ඇතුළුව මත්පැන් සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහනය කිරීම, මිළට ගැනීම සහ විකිණීම සඳහා බදු සහ බලපත්‍ර ගාස්තු සහ රා මැදීමේ බලපත්‍ර ගාස්තු

සුරාබදු අය කළ හැකි භාණ්ඩ මේ ප්‍රඥප්තියේ විධි විධානවලින් නිදහස් කිරීමට අමාත්‍ය වරයා සතු බලතල.

13. සුරා බදු අය කළ හැකි යම් භාණ්ඩයක් මුළු පළාත පුරාම හෝ යම් නිශ්චිත ප්‍රදේශයක් හෝ යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා හෝ යම් අවස්ථාවක් සඳහා හෝ යම් නිශ්චිත තැනැත්තන් පන්තියක් සම්බන්ධයෙන් හෝ මේ පරිච්ඡේදයේ විධි විධාන සියල්ලෙන්ම නැතහොත් කිසිවකින් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් නිදහස් කිරීම අමාත්‍යවරයා විසින් නිවේදනයකින් කළ හැකි අතර එවැනි නිදහස් කිරීමකදී සුදුසුයයි අමාත්‍යවරයා අදහස් කරන කොන්දේසි එයට අදාළ කරනු ලැබිය හැකිය.

විකිණීමේ සීමා.

14. සුරා බදු අය කරනු ලැබිය හැකි යම් භාණ්ඩයක් පිළිවෙලින් සිල්ලරට හෝ තොග වශයෙන් විකිණීමේදී මුළු පළාතම සම්බන්ධයෙන් හෝ යම් නිශ්චිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් සහ මිළට ගන්නන් සම්බන්ධයෙන් පොදුවේ හෝ යම් නිශ්චිත පන්තියක මිලට ගන්නන් සම්බන්ධයෙන් සහ පොදුවේ නැතහොත් යම් නිශ්චිත අවස්ථාවක් සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා ඒ සුරාබදු අය කළ හැකි භාණ්ඩයේ ප්‍රමාණය සීමා කිරීම අමාත්‍යවරයා විසින් නිවේදනයක් මගින් ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

.... 12

15. යුද්ධ හමුදා හෝ නාවික හමුදා නියෝග යටතේ සහ යුද්ධ හමුදා හෝ නාවික හමුදා නිලධරයන්ගේ අධීක්ෂණයට යටත්ව විවෘත කරනු ලැබ ඇති හෝ පවත්වාගෙන යනු ලබන යම් ආපන ශාලාවකට හෝ සාප්පුවකට හෝ තැබෑරුමකට මේ ප්‍රඥප්තියේ අඩංගු කිසිවක් අදාළ නොවන්නේය.

## II වන කොටස

## පිහිටුවීම සහ පාලනය කිරීම.

සුරාබදු ආදායම එකතුකිරීම ආදායම් පිළිබඳ නියෝජ්‍ය කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බව.

16. මේ ප්‍රඥප්තියේ වෙනත් ආකාරයට විධිවිධාන සලස්වා ඇති අවස්ථාවලදී හැර, සුරාබදු ආදායම එකතුකිරීම පළාතේ ආදායම් පිළිබඳ නියෝජ්‍ය කොමසාරිස්වරයා භාරයේ තිබිය යුතුය.

සුරාබදු කොමිෂන් සභාව සහ සුරාබදු දෙපා ර්තමේන්තුවේ වෙනත් කාර්යාල පත්කිරීම.

17. (අ) සුරාබදු කොමසාරිස්වරයෙකු පත්කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයාගේ සාමාන්‍ය විධානවලට සහ පාලනයට යටත්ව, ඔහු විසින් සුරාබදු දෙපාර්තමේන්තුවේ පාලනය සහ පරිපාලනය දැරීමද සුරාබදු ආදායම් එකතු කිරීමද මේ ප්‍රඥප්තිය යටතේ ආදායම් පිළිබඳ නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු සතු බලතල සහ කාර්ය සියල්ලම හෝ ඉන් කිසිවක් එවැනි නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු සමඟ සමගාමීව හෝ ඔහු වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමද කරනු ලැබිය හැකිය.

(ආ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සුරාබදු නිලධරයන් පත්කරනු ලැබිය හැකිය.

## III වන කොටස.

අමාත්‍යවරයාගේ බලතල.

18. අමාත්‍යවරයා විසින් මේ ප්‍රඥප්තිය බල පවත්වන මුළු පළාතම සඳහා හෝ යම් දිස්ත්‍රික්කයක් සඳහා හෝ යම් ප්‍රදේශයක් සඳහා -

(අ) මෙහි වගන්තිවල සඳහන් ක්‍රියා සහ කාර්ය ඉටුකිරීම සඳහා නිලධරයන් හෝ තැනැත්තන් පත්කරනු ලැබිය හැකිය.

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ සුරා බදු දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ තනතුරු නාම, බලතල සහ කාර්ය නියම කරනු ලැබිය හැකිය.

(ඇ) මේ වගන්තියේ (අ) සහ (ආ) යන ඡේද යටතේ යම් නිලධරයන් වෙත පවරනු ලැබූ බලතල කාර්ය සියල්ලම හෝ ඉන් කිසිවක් පළාත් ආදායම පිළිබඳ නියෝජ්‍ය කොමසාරිස් වරයකු විසින් ක්‍රියාත්මක කළ යුතු යයි නියම කරනු ලැබිය හැකිය.

සුරා බදු අයකළ හැකි භාණ්ඩ ප්‍රවාහණය කිරීම සඳහා අවසර පත්‍ර අවශ්‍ය බව.

19. සුරා බදු අය කළ හැකි භාණ්ඩ ප්‍රවාහණය කිරීමේදී පොදුවේ මුළු පළාත සඳහාම හෝ යම් ප්‍රදේශයක් සඳහා අමාත්‍යවරයා විසින් නිවේදනයක් මගින් නියම කරනු ලබන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක භාණ්ඩ, ඒ සඳහා නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් යටතේ මිස, ප්‍රවාහණය නොකළ යුතුය :

එසේ වුවද ස්වභාවය වෙනස් කරන ලද ස්ප්‍රීතු නොවන්නා වූ තීරු බදු ගෙවන ලද විදේශ මත්පැන් සම්බන්ධයෙන් එවැනි අවසර පත්‍රයක් අවශ්‍ය නොවන්නේය.

තීරු බදු අයකළ හැකි භාණ්ඩ ප්‍රවාහණය කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම.

20. (1) සුරා බදු අය කළ හැකි භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා වූ අවසර පත්‍ර සුරා බදු කොමසාරිස්වරයා විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි අතර ඒ අවසර පත්‍ර නිශ්චිත කාල පරිච්ඡේදයන් සහ සුරා බදු අය කළ හැකි නිශ්චිත භාණ්ඩ වර්ග සඳහා පොදු අවසර පත්‍ර හෝ විශේෂ අවස්ථා සහ විශේෂ භාණ්ඩ තොග සඳහා පමණක් වූ විශේෂ අවසර පත්‍ර ලබාගත හැකිය.

(2) මේ වගන්ති යටතේ ප්‍රදානය කරනු ලබන අවසර පත්‍ර අමාත්‍ය වරයා විසින් නිවේදනයක් මගින් නියම කරනු ලබන ආකෘති පත්‍රයක අනුසාරයෙන් විය යුතු අතර ඒ අවසර පත්‍ර නිකුත් කරනු ලබන තැනැත්තන් හම නියමිත තොරතුරු ඒවායේ අඩංගු කළ යුතුය.

....../ 14

## IV වන කොටස

සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහණය කිරීම, මිළට ගැනීම සහ විකිණීම

රා හැර සුරා බදු අය කළ හැකි වෙනත් භාණ්ඩ බලපත්‍රයක් නොමැතිව ගබඩා නොකළ යුතු බව හෝ රා හැර වෙනත් භාණ්ඩ සඳහා අවසර පත්‍ර නොදිය යුතු බව සහ බලපත්‍ර නොමැතිව රා මැදීමට අවසර නොදිය යුතු බව.

21. සුරා බදු කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ සහ එවැනි බලපත්‍රයක අඩංගු නියමයන් සහ කොන්දේසිවලට යටත්ව මිස -

(අ) රා නිපදවන යම් ගසක් මැදීම නොකළ යුතුය;

(ආ) කිසිවකින් රා ලබා නොගත යුතුය;

(ඇ) රා හැර වෙනත් සුරා බදු අය කළ හැකි භාණ්ඩයක් ගබඩා කිරීම සඳහා කිසිදු තැනැත්තකු විසින් යම් ස්ථානයක ගොඩනැගිල්ලක් හෝ ගබඩාවක් පවත්වා ගෙන යාම නොකළ යුතු අතර රා හැර වෙනත් එවැනි භාණ්ඩයක් තම සන්තකයෙහි තබා නොගත යුතුය.

(ඈ) විකිණීම සඳහා මත්පැන් බෝතල්වල ඇසිරීම නොකළ යුතුය.

සුරා බදු අය කළ හැකි භාණ්ඩ නියමිත ප්‍රමාණයට වැඩියෙන් ලඟ තබා ගැනීම.

22. (1) සිල්ලරට විකිණිය යුතු සීමාව වශයෙන් 14 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලබන ප්‍රමාණයක් ඉක්මවූ සුරා බදු අය කළ හැකි යම් භාණ්ඩ ප්‍රමාණයක්, තත් කාර්ය සඳහා සුරා බදු කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් යටතේ මිස , සුරා බදු අය කළ හැකි භාණ්ඩ විකිණීම සඳහා බල පත්‍ර නොලත් කිසිදු තැනැත්තකු විසින් තම සන්තකයේ තබා නොගත යුතුය. සද්භාවයෙන් වූ පෞද්ගලික පරිභරණය හෝ පාවිච්චිය සඳහා එවැනි සුරා බදු අය කළ හැකි භාණ්ඩයක් සන්තකයේ තබා ගැනීම සඳහා නිකුත් කරනු ලබන අවසර පත්‍ර වෙනුවෙන් ගාස්තුවක් අය නොකළ යුතුය;

...../ 15

එසේ වුවද පොදු ප්‍රවාහකයෙකුගේ හෝ කුලීකරුවෙකුගේ සන්තකයේ තිබෙන නැතහොත් යම් තැනැත්තකු විසින් විකිණීම සඳහා නොව තමන්ගේ සද්භාවයෙන් වූ පෞද්ගලික පරිභරණය සඳහා මිලට ගනු ලබන, ස්වභාවය වෙනස් කරන ලද ස්ප්‍රීතු නොවන යම් විදේශ මත්පැන් වලට මේ වගන්තියේ අඩංගු කිසිවක් ව්‍යාප්ත නොවන්නේය.

තවද එසේ වුවද සුරා බදු අය කළ හැකි යම් භාණ්ඩයන් සම්පූර්ණ පළාත පුරාම හෝ යම් ප්‍රදේශයක යම් තැනැත්තකු විසින් හෝ යම් තැනැත්තන් පන්තියක් විසින් සැපයීම හෝ තම සන්තකයේ තබා ගැනීම අමාත්‍යවරයා විසින් නිවේදනයක් මගින් සම්පූර්ණයෙන්ම තහනම් කරනු ලැබිය හැකිය.

බල පත්‍රයක් නොමැතිව සුරා බදු අයකළ හැකි භාණ්ඩ විකිණීම තහනම් බව.

23. සුරා බදු කොමසාරිස්වරයාගෙන් ලබා ගන්නා ලද බලපත්‍රයක් නොමැතිව සුරාබදු අය කළ හැකි කිසිදු භාණ්ඩයක් විකිණීම හෝ විකිණීම සඳහා තබා ගැනීම හෝ ප්‍රදර්ශනය කර තැබීම නොකළ යුතුය.

එසේ වුවද -

(අ) යම් කිසිවකින් රා ලබා ගැනීමේ බලය ඇති යම් තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ රා විකිණීමට බලපත්‍ර ලත් යම් තැනැත්තකු හෝ වෙනත් යම් නීතියක් යටතේ රා වලින් අරක්කු හෝ විනාකිරි නිෂ්පාදනය කිරීම සඳහා බලපත්‍ර ලත් යම් තැනැත්තකුට එකී රා බලපත්‍රයක් නොමැතිව විකුණනු ලැබිය හැකිය.

(ආ) යම් තැනැත්තකු විසින් තමන්ගේ පෞද්ගලික පාවිච්චිය සඳහා නීත්‍යානුකූලව මිලට ගන්නා ලද යම් විදේශ මත්පැන් කිසිවක් තමන් වැඩ කරන ස්ථානය හැර යාම හෝ තමන්ගේ රෝගය සුවවීම හෝ නිසා ඔහු විසින්ම නැතහොත් ඔහු වෙනුවෙන් නැතහොත් ඔහුගේ නියෝජිතයා වෙනුවෙන් ඔහු විසින් කරනු

ලබන විකිණීමට හෝ වෙන්දේසියට මේ වගන්තියේ අඩංගු කිසිවක් අදාළ නොවන්නේය.

දේශීය මත්පැන් තොග වශයෙන් හෝ සිල්ලරට සැපයීමේ තනි වරප්‍රසාද

24. සුරා බදු කොමසාරිස්වරයා විසින්, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව -

(අ) පළාතේ යම් ප්‍රදේශයක් තුළ දේශීය මත්පැන් කිසිවක් තොග වශයෙන් සැපයීම ;

(ආ) පළාතේ යම් ප්‍රදේශයක් තුළ දේශීය මත්පැන් තොග වශයෙන් හෝ සිල්ලරට විකිණීම ;

(ඇ) පළාතේ යම් ප්‍රදේශයක් තුළ දේශීය මත්පැන් තොග වශයෙන් සැපයීම සහ සිල්ලරට විකිණීම ; සහ

(ඈ) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ රීති වලින් නියමිත නැතහොත් මේ වගන්ති යටතේ අමාත්‍යවරයාගේ විධාන යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක ප්‍රකාර යම් හෝටලයක, සමාජ ශාලාවක හෝ තැබෑරුමක යම් විදේශීය මත්පැන් සිල්ලරට විකිණීම.

සඳහා වූ තනි වරප්‍රසාදය සුරා බදු කොමසාරිස්වරයා විසින් සුදුසුයයි සලකනු ලබන කොන්දේසි යටතේ සහ එසේ සුදුසු යයි සලකනු ලබන කාලයකට යම් තැනැත්තකු වෙත ප්‍රදානය කරනු ලැබිය හැකිය.

රා සඳහා වරප්‍රසාද ලත් තැනැත්තා විසින් බලපත්‍ර ප්‍රදානය කරනු ලැබිය හැකි බව.

25. රා ලබා ගැනීම සඳහා තනි වරප්‍රසාදය 24 වන වගන්තිය යටතේ ප්‍රදානය කොට ඇති අවස්ථාවකදී එකී බලපත්‍ර ලාභියා විසින් රා ලබා ගැනීම සඳහා දෙනු ලබන ලිඛිත අවසරයක්, 21 වන වගන්තිය යටතේ සුරාබදු කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රයක බලයම දරන බව අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

බලපත්‍ර ලාභියා විසින් තම වරප්‍රසාද කුලියට දීම හෝ පැවරීම කළහැකි බව.

26. යම් තනි වරප්‍රසාදයක් සඳහා වූ බලපත්‍ර ලාභියකු විසින් තම වරප්‍රසාදය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් මිලයට දීම හෝ පැවරීම, 24 වන වගන්තියේ පනවා ඇති යම් කොන්දේසියකට යටත්ව සහ සුරා බදු කොමසාරිස්වරයාගේ අනුමතියට යටත්ව, කරනු ලැබිය හැකිය. එසේ නමුත් එවැනි වරප්‍රසාද බදු ලාභියාට හෝ පැවරුම් ලාභියාට බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා යටකී වරප්‍රසාද ලාභියා විසින් සුරා බදු කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කරනු ලබන තෙක් සහ ඉල්ලුම් කරනු ලැබුවහොත් සහ එකී බදුලාභියා හෝ පැවරුම් ලාභියාට එවැනි බලපත්‍රයක් ලැබුනහොත් හෝ ලැ බෙන තුරු එවැනි බදු ලාභියකු හෝ පැවරුම් ලාභියකු විසින් යටකී වරප්‍රසාදය යටතේ යම් අයිතිබත් ක්‍රියාත්මක නොකළ යුතුය.

## <u>V වන කොටස</u>

### සුරා බදු අයකළ හැකි භාණ්ඩ සඳහා බලපත්‍ර බදු

සුරා බදු අයකළ හැකි භාණ්ඩ මත පැනවෙන බලපත්‍ර බද්ද.

27(1) සුරා බදු පැන විය හැකි යම් භාණ්ඩ විකිණීම සඳහා මේ ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ප්‍රදානය කොට ඇත්තේද එවැනි සුරා බදු අය කළ හැකි භාණ්ඩ විකිණීම සම්බන්ධයෙන් පළාත් සභාව විසින් නිර්ණය කරනු ලබන අනුප්‍රමාණයකට හෝ අනුප්‍රමාණවලට අනුකූල වූ (මෙහි මින් මතු බල පත්‍ර බද්ද යනුවෙන් සඳහන් කරනු ලබන) බද්දක් පළාත් සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් පනවනු ලැබිය හැකිය.

(2) තදනන්තර යෝජනා සම්මුතියක් මගින් එකී බද්දෙන් නිදහසක් ප්‍රදානය කිරීමේ සහ එකී නිදහස ප්‍රදානය කරනුයේ කවර කොන්දේසි සහ පරිවේෂණ යටතේ ද යන්න නිශ්චය කිරීමේ බලය ඉහත (1) වන උප වගන්තියේ සඳහන් යෝජනා සම්මුතියටම ඇතුළත් වේ.

## බලපත්‍ර

බලපත්‍ර හෝ අවසර පත්‍ර නිකුත් කිරීම.

28(1) මේ ප්‍රඥප්තිය යටතේ ප්‍රදානය කරනු ලබන සෑම බලපත්‍රයක්ම හෝ අවසර පත්‍රයක්ම:-

(අ) යම් ගාස්තුවක් වේ නම් ඒ ගාස්තුව ගෙවීම මත:

(ආ) යම් කාල පරිච්ඡේදයක් සඳහා:

(ඇ) යම් යම් කොන්දේසි වලට සහ සීමා කිරීම් වලට යටත්ව: සහ

(ඈ) නියමිත ආකෘතියට අනුකූලව:

විය යුතු අතර, තත් කාර්ය සඳහා පොදුවේ හෝ යම් විශේෂ අවස්ථාවකට අනුව හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන විස්තර එහි අඩංගු විය යුතුය.

(2) යම් බලපත්‍රයකට හෝ අවසර පත්‍රයකට අදාල යම් කොන්දේසියක් කඩ කරනු ලැබුවහොත් ඒ බලපත්‍රය හෝ අවසර පත්‍රය නිකුත් කරන නිලධරයා විසින් ඒ බලපත්‍රය හෝ අවසර පත්‍රය අවලංගු කරනු ලැබිය හැකිද යන්න සෑම බලපත්‍රයක්ම හෝ අවසර පත්‍රයකම ඇතුළත් කොන්දේසියක් විය යුතුය.

බලපත්‍රයක් අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ බලය.

29.(1) මේ ප්‍රඥප්තිය යටතේ යම් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නිකුත් කළ නිලධරයා විසින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන සීමා කිරීම් වලට යටත්ව යම් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් පහත සඳහන් අවස්ථාවලදී අවලංගු කිරීම හෝ අත්හිටුවීම කරනු ලැබිය හැකිය.:-

(අ) ඒ බලපත්‍රය හෝ අවසර පත්‍රය දරන්නා විසින් ගෙවිය යුතු ගාස්තුව යථා පරිදි නොගෙවනු ලැබුවහොත්:

(ආ) එවැනි බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් දරන්නා විසින් හෝ ඔහුගේ සේවකයෙක් විසින් හෝ ඔහුගේ ප්‍රකාශිතවම එසේ නැතහොත් ව්‍යංග අවසරය පිට ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තෙකු විසින් ඒ බලපත්‍රයේ හෝ අවසර පත්‍රයේ නියමයන් සහ කොන්දේසි අතුරින් කිසිවක් කඩ කරනු ලැබුවහොත්

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ තනි වරප්‍රසාදයක් දරණ තැනැත්තෙකු විසින් ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබූ විට.

(2) මේ වගන්තිය යටතේ යම් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් අවලංගු කිරීම හෝ අත් හිටුවීම සම්බන්ධයෙන් යම් වන්දි මුදලක් ලබා ගැනීමට හෝ එකී බලපත්‍රය හෝ අවසර පත්‍රය සම්බන්ධයෙන් ගෙවා ඇති හෝ ඇප වශයෙන් තබා ඇති යම් මුදල් ආපසු ඉල්ලා සිටීමට අයිතියක් බලපත්‍රයට හෝ අවසර පත්‍රය දරන්නා සතු නොවේ.

අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය යුතු බව.

30. (1) මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැකි අතර, එකී රීති සාදනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව විසින් මුල වෙනස් කිරීම් සහිතව හෝ රහිතව පළාත් සභාවේ යෝජනා සම්මුතියක් මගින් අනුමත කොට ඒ අනුමත කිරීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට හෝ තත් කාර්ය සඳහා නියම කරනු ලැබූ දිනයක සිට හෝ ඒ රීති වලංගුව බල පවත්වන්නේය.

(2) විශේෂයෙන්ම සහ, ඉහත සඳහන් විධි විධාන වල සාමාන්‍යත්වයට අගතියකින් තොරව, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකිය :-

(අ) නියෝජ්‍ය කොමසාරිස් වරයාගේ හෝ සුරාබදු කොමසාරිස් වරයාගේ බලතල කිසිවක් පැවරීම විධිමත් කරමින්:

(ආ) සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ බලතල සහ කාර්ය නියම කරමින් :

(ඇ) නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ සුරාබදු කොමසාරිස් වරයාගේ නියමයකට එරෙහිව අභියාචන ඉදිරිපත් කිරීමේ පරිපාටිය නියම කරමින් :

(ඈ) සුරාබද්දු අය කල හැකි යම් භාණ්ඩයක් ප්‍රවාහනය කිරීම විධිමත් කරමින්,

(ඉ) පහත දැක්වෙන දෑ ඇතුළුව, සුරා බද්දු අය කළ හැකි යම් භාණ්ඩයක් බෝතල් වල ඇසිරීම, සැපයීම හෝ ගබඩා කිරීම විධිමත් කරමින් -

(1) එවැනි භාණ්ඩයක් බෝතල් වල අසුරන, සපයන හෝ ගබඩා කරන යම් ස්ථානයක් සහ එහි භාවිත කැරෙන උපකරණ හා මෙවලම් පරීක්ෂා කිරීම, අධීක්ෂණය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම.

(11) රා නිපදවන ගස් මැදීම සහ එවැනි ගස්වලින් රා ලබා ගැනීම.

(ඊ) සුරාබද්දු අය කල හැකි යම් භාණ්ඩයක් ගුදමක තැන්පත් කිරීම සහ ඒ භාණ්ඩ එතැනින් ඉවත් කිරීම විධිමත් කරමින්:

(උ) සුරාබද්දු අය කළ හැකි යම් භාණ්ඩයක් තොග වශයෙන් හෝ සිල්ලරට විකිණීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී ඒවා අදාල වන කාල පරිච්ඡේද සහ ප්‍රදේශ නියම කරමින් :

(ඌ) යම් ප්‍රදේශයක එවැනි භාණ්ඩ විකිණීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට පෙර අනුගමනය කළයුතු කාර්ය පරිපාටිය සහ නිශ්චය කොට සොයා දැනගත යුතු කරුණු කවරේදැයි නියම කරමින් :

(එ) සුරාබද්දු අය කළ හැකි යම් භාණ්ඩයක් මත පැනවිය යුතු බලපත්‍ර බද්ද නියම කරමින් :

(ඒ) සුරාබද්දු අය කළ හැකි යම් භාණ්ඩයක් ගබඩා කිරීම සම්බන්ධයෙන් වූ යම් වරප්‍රසාදයක්, බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් සඳහා ගෙවිය යුතු ගාස්තු පරිමාණය හෝ ගාස්තු නියම කළ යුතු ආකාරය නියම කරමින් :

(ඔ) යම් ගාස්තුවක් හෝ බද්දක් ගෙවිය යුතු කාලය, ස්ථානය සහ ආකාරය විධිමත් කරමින් .

## VI වන කොටස

### මෝටර් වාහන බලපත්‍ර සහ රියැදුරු බලපත්‍ර නිකුත් කිරීම විධිමත් කිරීම.

ආදායම් බලපත්‍රයක් නොමැතිව මෝටර් වාහනයක් සන්තකයේ තබා නොගත යුතු බව.

31. (1) පළාත තුළ සාමාන්‍යයෙන් පදිංචි යම් තැනැත්තකු විසින් මෝටර් වාහනයක් තමන් සන්තකයේ තබා ගැනීමේදී හෝ පාවිච්චි කිරීමේදී, පළාතේ මෝටර් වාහන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඒ වාහනය ලියා පදිංචි කර ඇත්නම් සහ ඒ වාහනයේ සන්තකය දරණ තැනැත්තා ලියා පදිංචි කර ඇත්නම් ද ඒ වාහනය සඳහා වලංගුව බල පවත්නා ආදායම් බලපත්‍රයක් ලබා ගෙන ඇත්නම් මිස, එවැනි කිසිදු තැනැත්තෙකු විසින් එවැනි වාහනයක සන්තකය දැරීම හෝ පාවිච්චි කිරීම නොකළ යුතුය.

(2) ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් ඔප්පු කරනු ලැබුවහොත් මිස, යම් මෝටර් රථයක තත් කාලයේ අයිතිකරු ලෙස ලියා පදිංචි කර ඇති තැනැත්තා ඒ මෝටර් වාහනයේ සන්තකය දරණ තැනැත්තා හැටියට සලකනු ලැබේ.

(3) සාමාන්‍යයෙන් පළාත තුළ පදිංචිය නොදරන කිසිදු තැනැත්තකු විසින්, තමා පදිංචි වී සිටින පළාතේ නිසි බලධරයා විසින් ලියා පදිංචි කරනු ලැබූ ද, බලපත්‍ර නිකුත් කරනු ලැබූද, මෝටර් වාහනයක් නොවන මෝටර් වාහනයක සන්තකය පළාත තුළදී දැරීම හෝ එවැනි මෝටර් වාහනයක් පළාත තුළ පාවිච්චි කිරීම නොකළ යුතුය.

(4) මේ වගන්තියේ විධි විධාන කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, ඔහු එසේ වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි වූ දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයකට බරපතල වැඩ රහිත බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේය.

නියෝග

32.(1) මෝටර් වාහන ලියා පදිංචි කිරීමට සහ මෝටර් වාහන සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අදාල විධි විධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(2) ඉහත (1) වන උප වගන්තිය යටතේ සාදනු ලබන නියෝග මගින් වෙනත් දේ අතර, පහත දැක්වෙන කරුණු සඳහා විධි විධාන සලස්වනු ලැබිය හැකිය. :-

(අ) යම් පන්තියකට හෝ වර්ගයකට අයත් මෝටර් වාහන වල ගෙන යා හැකි තැනැත්තන් සංඛ්‍යාව විධිමත් කිරීම සහ එවැනි මෝටර් වාහන වල තත්ත්වය කලින් කල පරීක්ෂා කර බැලීම.

(ආ) වාහනයක ගෙන යා හැකි බඩු වල බර ප්‍රමාණය, ඒ බඩු පැටවිය යුත්තේ කොපමණ උසකට සහ කොපමණ පළලට සිටින සේ ද යන්න සහ වාහනයේ සම්පූර්ණ දිග ප්‍රමාණය කෙතෙක් විය යුතුද යන්න පිළිබඳ සීමා නියම කිරීම:

(ඇ) වාහන සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ බලපත්‍ර නිකුත් කරනු ලැබූ වාහන යොදවිය යුතු කාර්ය කවරේද යන්න ලියා පදිංචි කිරීම.

(ඈ) ලියා පදිංචි කරන ලද වාහන වලින් ප්‍රවාහනය කරනු ලබන මගීන් ගේ සහ මහජනයාගේ ආරක්ෂාව සහ සැප පහසුවද එවැනි වාහන වලින් ප්‍රවාහනය කරනු ලබන බඩු වලද ආරක්ෂාව සැලසීම පිණිස වෙනත් කවර වුවද කාර්යයන් සඳහා :

(ග) බලපත්‍ර අවලංගු කරනු ලැබිය හැක්කේ කවර තත්ත්වයන් යටතේ ද යන්න.

(3) සාදනු ලැබූ, වෙනස් කරනු ලැබූ හෝ සංශෝධනය කරනු ලැබූ නියෝග ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කළ යුතු අතර, ඒවා ඉන්පසු මෙහිලා ඒකාබද්ධකරනු ලැබූ පරිද්දෙන් නීත්‍යානුකූල සහ බල සහිත වන්නේය. තවද ඉන්පසු ඒ නියෝග පිළිබඳව අධිකරණමය සැළකිල්ල දක්වනු ලැබිය යුතුය.

(4) එවැනි සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ දින සිට මාසයක් ඇතුළත දී පළාත් සභාව වෙත ඉදිරිපත් කළයුතු අතර, කෙසේ වුවද එකී ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමෙන් පසු මාස 3 ක් ඉකුත් වීමට පෙර අනුමැතිය සඳහා එය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. සභාව වෙත නියෝග ඉදිරිපත් කිරීමෙන් පසු පැවැත්වෙන පළමුවන රැස්වීමේදීම සභාව විසින් යම් නියෝගයක් අනුමත නොකරනු ලැබුව හොත් එය අනුමත කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතු අතර සියලු කාර්ය සඳහා එය වලංගු සහ බල සහිත නියෝගයක් වන්නේය.

## අධිකරණය විසින් පනවනු ලබන දඩ

අධිකරණය විසින් පනවනු ලබන දඩ.

33.(1) පළාත තුළ ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කරන යම් අධිකරණයක් විසින් යම් ප්‍රඥප්තියක් යටතේ හෝ පාර්ලිමේන්තුව විසින් සාදන ලද නීතියක් යටතේ පනවනු ලැබූ යම් දඩයක්, ඒ අධිකරණයේ විධාන වලට යටත්ව, පළාතේ ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබිය යුතුය.

(2) පළාත් පාලන ආයතනයක් පිහිටුවමින් පාර්ලිමේන්තුව විසින් සාදනු ලැබූ නීතියක් වන්නා වූද, ඒ නීතියේ විධි විධාන හෝ ඒ නීතිය යටතේ සාදනු ලැබූ අතුරු ව්‍යවස්ථා හෝ කඩ කිරීම් සම්බන්ධයෙන් පනවනු ලබන දඩයක් ඒ නීතිය යටතේ පිහිටවනු ලැබූ පළාත් පාලන ආයතනයේ

අරමුදලට ගෙවිය යුතු බවට විශේෂ විධි විධානයක් ඒ නීතියේ අඩංගු වී ඇත්තා වූද, යම් නීතියක් යටතේ අධිකරණයක් විසින් පනවනු ලබන දඩයකට (1) වන උප වගන්තියේ විධි විධාන අදාල නොවන්නේය.

## ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධ බදු

ඉඩම් සහ ගොඩනැගිලි බදු

34.(1) රජයේ දේපල ද ඇතුලුව, පළාත තුළ පිහිටි ඉඩම් වල සහ ගොඩනැගිලි වල වටිනාකම මත, පළාත් සභාව විසින් යෝජනා සම්මුතියක් මගින් තීරණය කරනු ලබන අනු ප්‍රමාණය අනුව වූ බද්දක් එවැනි යෝජනාවක් මගින් පළාත් සභාව විසින් පනවනු ලැබිය හැකිය.

(2) එකී බද්දෙන් නිදහස් කෙරෙන ඉඩම් ද ගොඩනැගිලි සහ දේපල තිබේනම් ඇත්නම් ඒවා කවරේදැයි එකී යෝජනා සම්මතියේම නිශ්චිතව දැක්විය යුතුය.

## රජයේ ඉඩම් ආඥා පනත යටතේ සහ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නියාදනය කරන ලද ඉඩම් සඳහා වූ ගාස්තු

රජයේ ඉඩම් ආඥා පනත යටතේ සහ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නියාගදනය කරන ලද ඉඩම් සඳහා වූ ගාස්තු

35.(1) රජයේ ඉඩම් ආඥා පනත යටතේ සහ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නියාදනය කරනු ලැබූද, පළාත තුළ පිහිටියා වූද, ඉඩම් සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබිය යුතුය.

## මුද්දර ගාස්තු සහ අධිකරණ ගාස්තු

මුද්දර ගාස්තු සහ අධිකරණ ගාස්තු

36.(1) පළාත තුළ පිහිටි ඉඩම් ඇතුළු දේපල පැවරීම මත ගෙවිය යුතු මුද්දර ගාස්තු පළාත් ආදායම් කොමසාරිස් වරයා වෙත ගෙවනු ලැබිය යුතුය.

(2) පළාත තුළ යම් මෝටර් වාහනයක් අයිතිය පවරා දීම මත ගෙවිය යුතු මුද්දර ගාස්තු පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබිය යුතුය.

(3) පළාත තුළ ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලබන ලේඛන මත ගෙවිය යුතු මුද්දර ගාස්තු ද ඇතුළුව ගෙවිය යුතු අධිකරණ ගාස්තු, ඒවා අය කර ගන්නා අධිකරණය විසින් පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතුය.

වන සත්ව වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ

<u>ආඥා පනත යටතේ ගෙවනු ලබන ගාස්තු</u>

*වන සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනත යටතේ ගෙවනු ලබන ගාස්තු*

37(1) වන සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද යම් ජාතික රක්ෂිත ප්‍රදේශයක ජාතික වනෝද්‍යානයක, අන්තර් කලාපයක සම්පූර්ණයෙන්ම හෝ එවැන්නක යම් කොටසක් හෝ පළාත තුළ පිහිටුවා ඇති අවස්ථාවකදී, නියමිත ගාස්තු ගෙවා නියමිත නිලධරයන්ගෙන් අදාල පරිදි ලබා ගන්නා ලද බලපත්‍රයක හෝ අවසර පත්‍රයක බලය යටතේ මිස, පළාත තුළ පිහිටි ඒ රක්ෂිත ප්‍රදේශය, වනෝද්‍යානය හෝ ආරක්ෂිත කලාපයට නැතහොත් ඉන් කොටසකට අයිති කිසිදු තැනැත්තෙකුට ඇතුල්වීමට හෝ රැඳී සිටීම නොකරනු ලැබිය යුතුය.

(2) ඒ ආඥා පනතේ 4, 5, 12, 13, 42 සහ ..43... වන වගන්ති වල විධි විධාන මේ ප්‍රඥප්තියේම කොටසක් වූ පරිද්දෙන් කියවා තේරුම් ගත යුතු අතර, යටකී බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නිකුත් කිරීමේදී ඒ විධි විධාන අදාල වන්නේය. තවද එකී විධි විධාන අවස්ථාවෝචිත පරිදි කිරීමේදී එහි සඳහන් නිලධරයන් යන්නෙන්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ පළාතේ නියමිත නිලධරයන් අදහස් වන අතර, නියමිත ගාස්තුව යන්නෙන්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ ගාස්තු ද අදහස් වේ.

## වාර වාර්තා

වාර වාර්තා සහ තොරතුරු සැපයිය යුතු බව.

38.(1) පළාතේ ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් නම් කරනු ලැබූ යම් තක්සේරුකරුවකු විසින් ලිඛිත දැන්වීමක් යම් තැනැත්තකු වෙත යවමින්, ඒ තැනැත්තාගෙන් අය විය යුතු යම් බද්දක් තීරු බද්දක් හෝ ගාස්තුවක් සම්බන්ධයෙන් යම් වාර වාර්තාවක් තත් කාර්ය සඳහා නියමිත ආකෘතිය මගින්, ඒ දැන්වීමේ සඳහන් කාලය තුළදී සපයන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය.

(2) යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ ප්‍රඥප්තිය යටතේ බදු, තීරු බදු හෝ ගාස්තු ගෙවිය යුතු යම් තැනැත්තකුට වාර වාර්තාවක් සපයන ලෙස 1 වන උප වගන්තිය යටතේ නියම කර නොමැති අවස්ථාවකදී ඒ තක්සේරු වර්ෂය ආරම්භ වූ දින සිට දින 14 ක් ගතවූවාට පසු, ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු බද්ද, තීරු බද්ද හෝ ගාස්තුව සඳහන් කරමින් වාර වාර්තාවක් ඔහු විසින් සපයනු ලැබිය යුතුය.

(3) එවැනි වාර වාර්තාවකට අදාල වැඩිදුරටත් වූ විස්තර සපයන ලෙස නියෝජ්‍ය කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් නම් කරනු ලැබූ තක්සේරුකරුවකු විසින් දැන්වීමක් මගින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි අතර, ඒ තැනැත්තාගේ ව්‍යාපාරයට අදාල පොත්, වාර්තා සහ ලදුපත් ඉදිරිපත් කරන ලෙස තදනන්තර දැන්වීමක් මගින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය.

39. මේ වගන්තිය යටතේ යවන ලද දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත් වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබුවහොත් රුපියල් දහසකට නොවැඩි දඩයකට ඒ තැනැත්තා යටත් වන්නේය.

## V වන පරිච්ඡේදය

### බදු ගාස්තු

බදු ගාස්තු

40. යම් කාර්තුවක් සඳහා ගෙවිය යුතු බද්ද ඒ කාර්තුව අවසාන වී එළඹෙන මාසයේ 15 වන දිනට පසුවීමට පෙර ගෙවිය යුතුය. එසේ නොගෙවනු ලැබූ යම් බද්දක් පැහැර හරින ලද බද්දක් සේ සලකනු ලැබිය යුතු අතර ඒ බද්ද ගෙවිය යුතු තැනැත්තා හෝ ඒ බද්ද එක් තැනැත්තකුට වැඩි සංඛ්‍යාවක් විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවිය යුතු වන අවස්ථාවක ඒ එක් එක් තැනැත්තා හෝ ඒ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා බදු ගෙවීම පැහැර හැරිය තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතුය.

එසේ වුවද යම් ව්‍යාපාරයක යම් පූර්ව කාර්තුවක පිරිවැටුම් බද්ද රුපියල් පනස් ලක්ෂය ඉක්මවන අවස්ථාවකදී ඊළඟට එළඹෙන කාර්තුව සඳහා ගෙවිය යුතු බද්ද පහත සඳහන් පරිදි විය යුතුය:-

(අ) පෙරාතුවම වූ කාර්තුව සඳහා ගෙවිය යුතු බද්දෙන් තුනෙන් එක් පංගුවක් ඊළඟට එළඹෙන කාර්තුවේ දෙවන මාසයේ පහළොස්වන දින පසුවීමට පෙර ගෙවිය යුතුය.

(ආ) පෙරාතුවම වූ කාර්තුව සඳහා ගෙවිය යුතු බද්දෙන්, තුනෙන් එක් පංගුවක් ඊළඟට එළඹෙන කාර්තුවේ තුන්වන මාසයේ 15 වන දින දී හෝ ඊට පෙර ගෙවිය යුතුය :

(ඇ) ඊළඟට එළඹෙන කාර්තුව සඳහා ගෙවිය යුතු බද්දෙන්, ඉහත (අ) වන සහ (ආ) වන ඡේද යටතේ ගෙවන ලද මුදල් ප්‍රමාණ අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල ඒ කාර්තුවේ අවසානයට පසු එළඹෙන මාසයේ පහළොස්වන දින පසුවීමට පෙර ගෙවිය යුතුය.

එසේ නොගෙවනු ලැබූ යම් බද්දක් ගෙවීම පැහැර හැරි බද්දක් සේ සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද එක් තැනැත්තකු විසින් ගෙවිය යුතු අවස්ථාවකදී ඒ තැනැත්තා හෝ එක් තැනැත්තකුට වැඩි සංඛ්‍යාවක් ඇතිගම් හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවිනු ලැබිය යුතු අවස්ථාවකදී ඒ එක් එක් තැනැත්තා සහ ඒ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා බදු ගෙවීම පැහැර හැරි තැනැත්තක් ලෙස සලකනු ලැබේ.

පැහැර හැර ඇති බදු.

41(1) යම් බද්දක් ගෙවීම පැහැර හැර ඇති විටක, එසේ පැහැර හැර ඇති තැනැත්තා විසින් පැහැර හැරි බද්දට අමතරව දඩ වශයෙන් පහත දැක්වෙන ගෙවීම් කළ යුතුය :-

(අ) පැහැර හැර ඇති මුදලෙන් සියයට දහයකට සමාන මුදලක් :

සහ

(ආ) යම් බද්දක් ගෙවීමට පැහැර හැරීම ආරම්භ වී ඇත්තේ කවර මාසයක දී ද ඒ මාසයට පසුව එළඹෙන මාසයේ පහළොස්වන දිනට පෙර එසේ පැහැර හැර ඇති මුදල නොගෙවනු ලබන අවස්ථාවකදී ඒ පැහැර හැරීම පැවතියදී ඊට පසු එළඹෙන එක් එක් මාසයේ පහළොස්වන දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය හෝ ඒ කාල පරිච්ඡේදයෙන් කොටසක් සඳහා පැහැර හැර ඇති මුදලින් සියයට දෙකකට සමාන වැඩිපුරටත් වූ මුදලක්.

## V1 වන පරිච්ඡේදය

## තක්සේරු කිරීම්

තක්සේරු කිරීම්.

42(1) තක්සේරුකරු වනුගේ මතය අනුව, බදු අය කරනු ලැබිය හැකි යම් තැනැත්තකු, 38 වන වගන්තිය යටතේ යම් කාර්තුවක් සඳහා සැපයිය යුතු වාර වාර්තාවක් සැපයීම පැහැර හැරියහොත්, ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුව තිබුණේ යයි තක්සේරුකරු නිගමනය කරන බද්දක ප්‍රමාණය තක්සේරුකරු විසින් තක්සේරු කරනු ලැබිය යුතු අතර, ඒ මුදල වහාම

ගෙවන ලෙස ලිඛිත දැන්වීමක් මගින් ඒ තැනැත්තාට නියම කල යුතුය. යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් එසේ තක්සේරුකරු කරනු ලැබූ බදු මුදල, 46 වන වගන්තියේ විධි විධාන වලට යටත්ව, ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව සඳහා ගෙවිය යුතු බදු ප්‍රමාණය වශයෙන් සලකනු ලැබිය යුතුය.

එසේ වුවද, යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් බැහැර යාමට ආසන්න බව හෝ, ආදායම ආරක්ෂා කිරීම සඳහා, (7) වන වගන්තියෙන් නියමිත කාලයට කලින් කොමසාරිස්වරයා වෙත බදු ගෙවන ලෙස යම් තැනැත්තකුට නියම කිරීම ප්‍රඥාගෝචර බව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවකදී යම් කාර්තුවක් අවසාන වීමෙන් පසු එළඹෙන පසලොස්වන දිනයට පෙර කවර වේලාවකදී වුවද ඒ කාර්තු සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් තක්සේරු කිරීම තක්සේරුකරු විසින් කරනු ලැබිය හැකිය. එසේ ගෙවනු නොලබන යම් බද්දක් ඒ කාර්තුව සඳහා පැහැර හරින ලද බද්දක් ලෙස සලකනු ලැබිය යුතුය.

(2) යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් (1) වන උප වගන්තිය යටතේ කරනු ලැබූ තක්සේරුවක්, ඒ තැනැත්තාගෙන් ඒ කාර්තුව සඳහා අය විය යුතු බදු ප්‍රමාණය පරිද්දෙන්, 8 වන වගන්තිය යටතේ වූ දඩයක් ගෙවීමට ඒ තැනැත්තා යටත්ව ඇති බැඳීමක් කෙරෙහි බල නොපාන්නේය.

(3) යම් කාර්තුවක් සඳහා වූ වාර වාර්තාවක් 38 වන වගන්තිය යටතේ සැපයීම පැහැර හැරියාවූ යම් තැනැත්තකු විසින් ඒ කාර්තුව සඳහා බදු වශයෙන් ගෙවන ලද මුදල්ප්‍රමාණය ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව සඳහා ගෙවිය යුතුව තිබුණු සැබෑ බදු ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථාවකදී, ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුව තිබුණු මුදල් ප්‍රමාණය, තක්සේරුකරුගේ නිගමනයට අනුව, තක්සේරුකරු විසින් තක්සේරු කළයුතු අතර ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් යවමින්, එසේ තක්සේරු කරන ලද මුදල් ප්‍රමාණය සහ ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය අතර ඇති වෙනස ඒ දැන්වීමෙහි සඳහන් දිනදී හෝ ඊට පෙර ගෙවන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය යුතුය.

(4) යම් තැනැත්තකු සම්බන්ධයෙන් යම් කාර්තුවක් සඳහා (3) වන උප වගන්තිය යටතේ ඇස්තමේන්තුවක් කර ඇති අවස්ථාවකදී, එසේ ඇස්තමේන්තුකරන ලද මුදල් ප්‍රමාණය සහ පිරිවැටුම් බදු වශයෙන් ඒ තැනැත්තාවිසින් ඒ කාර්තුව සඳහා ගෙවා ඇති මුදල් ප්‍රමාණය ද අතර ඇති වෙනස, ඒකාර්තුව සඳහා ගෙවීම පැහැර හැර ඇති බදු ප්‍රමාණය වශයෙන් සැලකිය යුතු අතර, ඒ අනුව , 40 වන වගන්තිය යටතේ ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව සඳහා බදු ගෙවිය යුතුව තිබුණු දින සිට ඒ බදු ප්‍රමාණය සම්බන්ධයෙන් 41 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ වූ දඩයට ඒ තැනැත්තා යටත් වන්නේය.

අයවිය යුතු මුදලට වඩා අඩු ස්වයං තක්සේරු.

43.(1) බදු ගෙවීමට යටත් යම් තැනැත්තකු විසින් යම් කාර්තුවක් සඳහා ගෙවිය යුතු නියමිත බද්දට හෝ ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතු බද්දට හෝ වඩා අඩු මුදල් ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවා ඇති අවස්ථාවකදී, තක්සේරුකරුගේ නිගමනයට අනුව, ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුව තිබුණු අමතර මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් කවර වේලාවක වුවද තක්සේරුකරු විසින් ඒ තැනැත්තා තක්සේරු කරනු ලැබිය හැකිය. තවද තක්සේරුකරු විසින් ඒ තැනැත්තාට තක්සේරු දැන්වීමක් භාර දිය යුතුය.

(2) යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන්, (1) වන උප වගන්තිය යටතේ තක්සේරුවක් කරන ලද අවස්ථාවක එසේ තක්සේරු කරන ලද මුදල ඒ කාර්තුව සඳහා නොගෙවා පැහැර හරින ලද පිරිවැටුම් බද්ද ලෙස සැලකිය යුතුය. ඒ අනුව 40 වන වගන්තිය යටතේ ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ඒ බද්ද ගෙවිය යුතුව තිබුනේ යම් දිනයක දී එදින සිට ඒ තැනැත්තා 41 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය යටතේ ඒ මුදල සම්බන්ධයෙන් දණ්ඩනය ගෙවීමට යටත් විය යුතුය.

44. යම් තැනැත්තකු විසින් 38 වන වගන්තිය යටතේ යම් කාර්තුවක් සඳහා සපයන ලද වාර්තාවක්, තක්සේරුකරු විසින් පිළිනොගෙන ඒ තැනැත්තා සම්බන්ධයෙන් ඒ කාර්තුව සඳහා 42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය යටතේ තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කරනු ලබන අවස්ථාවක ඔහු විසින් වාර්තාව පිළිනොගැනීමට හේතු නැතහොත් තැපෑලෙන් යවන ලද ලියාපදිංචි කරන ලද ලිපියක් මගින් ඒ තැනැත්තාට ලියවිල්ලකින් දැන්විය යුතුය.

## V11 වන පරිච්ඡේදය

කොමසාරිස් වෙත කරනු ලබන අභියාචනා.

45. (1) මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් තක්සේරු කරුවකු විසින්කරන ලද යම් තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ ඒ තැනැත්තා වෙත පනවන ලද දණ්ඩනයක් සම්බන්ධයෙන් හෝ ඒ තැනැත්තා අතෘප්තියට පත් වන්නේ නම්, ඒ තක්සේරුව අතිරේක තක්සේරුව හෝ දණ්ඩනය පිළිබඳ දැන්වීම භාරදීමේ දිනයට පසු දින තිහක් ඇතුළත ඒ තක්සේරුවට, අතිරේක තක්සේරුවට හෝ දණ්ඩනයට විරුද්ධව ඒ තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත අභියාචනය කළහැකිය. අභියාචනය කරනු ලැබුවද මේ පනතින් ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් සමග ඒ තක්සේරුව මගින් හෝ අතිරේක තක්සේරුව මගින් අය කරන ලද පිරිවැටුම් බද්ද ගෙවිය යුතුය. ඒ අභියාචනය තීරණය කරනු ලබන තෙක් පිරිවැටුම් බද්ද හෝ එහි යම් කොටසක්, හෝ ගෙවීම කල් තබනු ලැබිය යුතු බවට කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබුවහොත් මිස, මේ පනතින් ඒ තැනැත්තා වෙත නියම කරන ලද යම් දණ්ඩනයක් සමග ඒ තක්සේරුව මගින් හෝ අතිරේක තක්සේරුව මගින් අය කරන ලද පිරිවැටුම් බද්ද ගෙවිය යුතුය. ඒ නියමය කරනු ලැබූ විට කල් තබනු ලැබූ පිරිවැටුම් බද්දෙහි මුදල හෝ එහි කොටස් පැහැර හරිනු ලැබූ ලෙස සලකනු නො ලැබිය යුතුය.

එසේ වුවද ශ්‍රී ලංකාවෙහි නොසිටීම, රෝගාතුරවීම හෝ වෙනත් යුක්ති සහගත හේතූන් නිසා අභියාචකට ඒ කාල සීමාව ඇතුළත අභියාචනය කිරීමට නොහැකි වූ බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වූ විට අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා වූ කාල සීමාව දීර්ඝ කරනු ලැබිය හැකිය.

(2) සෑම අභියාචනයක්ම කොමසාරිස්වරයා වෙත යොමු කරනු ලබන ලිඛිත පෙත්සමක් මාර්ගයෙන් ඉදිරිපත් කළයුතු අතර ඒ අභියාචනයට හේතු එහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

(3) අභියාචනය කරනු ලබන්නේ යම් තක්සේරුවකට හෝ අතිරේක තක්සේරුවකට විරුද්ධවද, ඒ තක්සේරුව හෝ අතිරේක තක්සේරුව , වාර්තාවක් සපයා නැති අවස්ථාවක කරන ලද විටෙක නිසියාකාරව පිළියෙළ කරනලද වාර්තාවක් සමඟ අභියාචන පෙත්සම ඉදිරිපත් කළයුතුය.

(4) (2) වන සහ (3) වන උප වගන්තිවල විධිවිධානවලට අනුකූල නොවන සෑම අභියාචන පෙත්සමක්ම වලංගු නොවිය යුතුය.

(5) වලංගු අභියාචනා පෙත්සමක් ලැබීමෙන් පසු කොමසාරිස්වරයා විසින් තක්සේරුකරුවෙකුගේ මාර්ගයෙන් වැඩිදුර පරීක්ෂණ කිරීමට සැලැස්විය හැකි අතර, අභියාචන පෙත්සමෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ඒ පරීක්ෂණයේදී එකඟවීමකට එළඹුනහොත් තක්සේරුව අවශ්‍ය පරිදි සකස්කර ගත යුතුය.

(6) (5) වන උප වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට අභියාචක සහ තක්සේරුකරු අතර එකඟවීමක් ඇති නොවූ අවස්ථාවක , අභියාචනය විභාග කිරීම සඳහා වේලාවක් සහ ස්ථානයක් කොමසාරිස්වරයා විසින් නියම කළ යුතුය.

(7) සෑම අභියාචකයෙකුම, අභියාචනය විභාග කිරීම සඳහා නියම කරනු ලැබූ වේලාවෙහි සහ ස්ථානයෙහි කොමසාරිස්වරයා ඉදිරියේ පැමිණ සිටිය යුතුය. පුද්ගලික හෝ බලයලත් නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ අභියාචකට අභියාචන විභාගයට පෙනී සිටිය හැකිය. අභියාචනයක විභාගය අඩාලව කල්තැබීම සුදුසුයයි කොමසාරිස්වරයා කල්පනා කරන්නේ නම් , තමා විසින් නියම කරනු ලබන වේලාවකදී සහ ස්ථානයකදී පැවැත්වීම පිණිස ඔහු විසින් අභියාචනයක විභාගය කලින් කල අඩාලව කල්තැබිය හැකිය. අභියාචක වෙනුවෙන් බලයලත් නියෝජිතයෙකු පැමිණ සිටින කවර හෝ අවස්ථාවක අභියාචනයේ විභාගය කොමසාරිස්වරයා විසින් අඩාලව කල්තැබිය හැකි අතර, අභියාචනය විනිශ්චය කිරීම සඳහා අභියාචක පුද්ගලිකව පැමිණ සිටීම අවශ්‍යයයි කොමසාරිස්වරයා සලකන්නේ නම්, අඩාලව කල් -

තැබූ විභාගයක් සඳහා හෝ නියම කරනු ලැබූ වේලාවෙහි හා ස්ථානයේ පැමිණ සිටීම අභියාචක විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් හෝ පැහැර හරිනු ලැබුවහොත්, නැතහොත් පුද්ගලිකව පැමිණ සිටීමට කොමසාරිස්වරයා විසින් අභියාචකට නියම කරනු ලැබ එසේ පැමිණ සිටීම ඔහු විසින් පැහැරහරිනු ලැබුවහොත් කොමසාරිස් වරයා විසින් අභියාචනය නිෂ්ප්‍රභා කරනු ලැබිය හැකිය.

එසේ වුවද, අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලැබීමෙන් පසු යුක්තියහගත කාලයක් ඇතුළත අභියාචක විසින් ඒ අභියාචනයේ විභාගයේදී හෝ අඩාලව තල් තැබූ යම් අභියාචනයක විභාගයකදී ඔහු හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයා නිසි පරිදි පැමිණ සිටීම වලක්වනු ලැබූ හෝ ශ්‍රී ලංකාවේ නොසිටීම, රෝගාතුරභාවය හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් නිසා බවට කොමසාරිස්වරයා සෑහීමට පත්කරනු ලැබුවහොත් කොමසාරිස්වරයා විසින් යටකී නිෂ්ප්‍රභ කිරීමේ නියමය ඉවත්කොට, අභියාචනයේ විභාගය සඳහා වේලාවක් සහ ස්ථානයක් නියම කළ හැකිය.

(8) අභියාචනය සම්බන්ධයෙන් සාක්ෂි දිය හැකි යයි කොමසාරිස්වරයා විසින් සලකනු ලබන යම් තැනැත්තකු තමා ඉදිරියෙහි පෙනී සිටින ලෙස කැඳවීමේ බලය කොමසාරිස්වරයාට ඇති අතර, ඒ තැනැත්තා දිවුරුම් පිට හෝ අන් ලෙසකින් හෝ විභාග කරනු ලැබිය හැකිය. එසේ පැමිණීමේදී ඒ තැනැත්තා විසින් අවශ්‍යයෙන්ම දරන ලද යම් යුක්ති සහගත වියදමක් ලබා ගැනීමට කොමසාරිස්වරයා විසින් ඔහුට ඉඩ සැලසිය හැකිය.

(9) යම් අභියාචනයක් පිළිබඳ ස්වකීය තීරණය කිරීමට පෙර, කොමසාරිස්වරයා විසින් එසේ කිරීම අවශ්‍ය යයි සලකතහොත්, යම් තැනැත්තෙකු ට්විත ලියවිල්ලකින් වූ දැන්වීමක් කිරීමෙන්, එම තැනැත්තා සන්තකයෙහි තිබෙන්නා වූද, එම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන්නාවූද, යම් ඔප්පු, පිඹුරු, සාධනපත්‍ර පොත්, ගිණුම් වෙළෙඳ ලැයිස්තු , තොග ලැයිස්තු ලේඛණ, චෙක්පත්, ගෙවීම් කුණ්ඩු, විගනක වාර්තා හෝ වෙනත් ලේඛණ ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත පරීක්‍ෂා කිරීම පිණිස ඉදිරිපත් කරන ලෙස හෝ කොමසාරිස්වරයා වෙත එවන ලෙස හෝ එම තැනැත්තාට නියම කළ හැකිය.

(10) අභියාචනය සම්බන්ධයෙන් අභියාචකගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ සාක්ෂි කොමසාරිස්වරයා විසින් විභාග කරනු ලබන අවස්ථාවක, ඒ සාක්ෂි පිළිබඳ වාර්තාවක් තබාගැනීම හෝ තබා ගැනීමට සැලැස්වීම කොමසාරිස්වරයා විසින් කළයුතුය.

(11) මේ වගන්තිය යටතේ අභියාචනයක් නිශ්චය කිරීමේදී, අභියාචනා කරන ලද්දේ යම් තක්සේරුවකට විරුද්ධවද, ඒ තක්සේරුව ස්ථිර කිරීම, අඩු කිරීම , වැඩි කිරීම හෝ අවලංගු කිරීම කොමසාරිස්වරයා විසින් කරනු ලැබිය හැකි අතර, ඒ අභියාචනය සම්බන්ධයෙන් ඔහුගේ නිශ්චය කිරීමඅභියාචක වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය හැකිය.

(12) අභියාචනයක් අවසාන වශයෙන් තීරණය කරනු ලැබීම මත හෝ කොමසාරිස්-වරයා විසින් කරනු ලැබූ නියමයන් මත (1) වන උප වගන්තිය යටතේ කල්තබනු ලැබූ යම් පිරිවැටුම් බද්දක් ගෙවිය යුතු වන අවස්ථාවක හෝ, මුල් තක්සේරුවෙන් අයකරනු ලැබූ පිරිවැටුම් බද්ද වැඩිකරනු ලැබූ අවස්ථාවක, එවැනි යම් පිරිවැටුම් බද්දක් හෝ පිරිවැටුම් බද්දෙහි ශේෂය ගෙවිය යුත්තේ යම් දිනයකදී නැතහොත් ඊට පෙරද, ඒ දිනය සියම කළමින් ලියවිල්ලකින් වූ දැන්වීමක් කොමසාරිස්වරයා විසින් අභියාචකට දෙනු ලැබිය යුතුය. ,එසේ ගෙවනු නොලැබූ යම් පිරිවැටුම් බද්දක් පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(13) යම් තක්සේරුවකට විරුද්ධව අභියාචනයක් කර ඇත්තාවූ අවස්ථාවක සහ තක්සේරුව පිළිබඳ දැන්වීමෙහි සඳහන් යම් පිරිවැටුම් බද්දක් ගෙවීම (1) වන උප වගන්තිය යටතේ කල්තබා ඇත්තාවූ අවස්ථාවක, ඒ අභියාචනය සම්බන්ධයෙන් පරීක්ෂණයක් අතරතුර හෝ ඒ අභියාචනය විභාග කිරීමේදී ඒ තක්සේරුව සම්බන්ධ-යෙන් පිරිවැටුම් බද්ද වශයෙන් යම් මුදලක් ගෙවිය යුතු බවට හෝ ගෙවිය යුතු විය හැකි බවට අභියාචක එකඟ වේනොත්, කොමසාරිස්වරයා විසින් අභියාචකට දෙනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, එම දැන්වීමෙහි සඳහන් දින හෝ -

ට පෙර ඒ මුදල ගෙවීමට විධාන කරනු ලැබිය හැකිය. එසේ ගෙවනු නොලැබුවාවූ යම් මුදලක් පැහැර හරිනු ලැබූ සේ සලකනු ලැබිය යුතුය.

සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනය කිරීම.

46. 45 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා වෙත කරනලද අභියාචනයක් සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, 1979 අංක.28 දරණ දේශීය ආදායම් පනත යටතේ පිහිටුවනු ලැබූ සමාලෝචන මණ්ඩලය වෙත ඒ තීරණයට විරුද්ධව අභියාචනය කරනු ලැබිය හැකි අතර, ඒ මණ්ඩලය වෙත කරනු ලැබූන අභියාචනවලට අදාළ ඒ පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ වන අභියාචනය කට අදාළ විය යුතුය.

නීති ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචන.

47. (1) සමාලෝචන මණ්ඩලයේ තීරණය අවසානාත්මක විය යුතුය.

එසේ වුවද, අභියාචනාධිකරණයේ මතය සඳහා නීති ප්‍රශ්නයක් ගැන කරුණු සැල කිරීමක් ඉදිරිපත් කරන ලෙස අභියාචක හෝ කොමසාරිස්වරයා විසින් සමාලෝචන මණ්ඩලය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකිය.

(2) අභියාචනාධිකරණය වෙත හා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනා ඉදිරිපත් කිරීමට අදාළ 1979 අංක.28 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේවූ අභියාචනයකට අදාළ විය යුතුය.

## 1/111 වන පරිච්ඡේදය.

තක්සේරුවල නිශ්චිතභාවය සහ වැරදි චාර්තා සඳහා දඬුවම්

එකඟවී ඇති තක්සේරුව හෝ අභියාචනයේ තීරණය අවසානාත්මක බව.

48. පරිවැටුම් බද්ද සම්බන්ධයෙන් තක්සේරුවකට විරුද්ධව මේ ප්‍රඥප්තියේ නියමිත කාලසීමාව තුළම වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති අවස්ථාවක, හෝ ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් 45(5) වන වගන්තිය යටතේ එකඟවී ඇති අවස්ථාවක, හෝ අභියාචනයේදී

නිශ්චය කරනු ලැබ, ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, කරනලද හෝ එකඟවන ලද හෝ අඩුකරන ලද හෝ වැඩි කරනලද හෝ ස්ථිර කරනලද තක්සේරුව ඒ බද්දේ ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනතේ සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක වන්නේය.

එසේවුවද, යම් කාර්තුවක් සඳහා අභියාචනයේදී නිශ්චය කරනු ලැබ ඇති යම් කරුණක් නැවත සලකා බැලීම ඇතුළත් නොවන්නේ නම්, ඒ කාර්තුව සඳහා තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් කිරීමෙහිලා තක්සේරුකරුවෙකු මේ ප්‍රඥප්තියේ අඩංගු කිසිවක් නිසා නොවැළැක්වෙන්නේය.

**ගෙවනලද මුදලට වඩා බද්ද වැඩිවන අවස්ථාවකදී, වංචාවක් නොමැති විටක, කොමසාරිස් වරයා විසින් දණ්ඩයක් නියම කළ හැකි බව.**

49. යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් කරන ලද තක්සේරුවකදී, පිරිවැටුම් බද්දේ ප්‍රමාණය, ස්වකීය වාර්තාවේ නියමිත පිරිවැටුම් මත අයවිය යුතු මුදල් ප්‍රමාණය ලෙස ඔහු විසින් එවකටත් ගෙවනු ලැබ ඇති මුදල් ප්‍රමාණය ඉක්මවන්නාවූද, තක්සේරුව 48 වන වගන්තිය යටතේ අවසානාත්මක හා තීරණාත්මක වන්නාවූද අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ස්වකීය වාර්තාවේ පිරිවැටුම එළිදරව් කිරීමේදී හෝ ඒ පිරිවැටුම සම්බන්ධ පිරිවැටුම් බදු අනු ප්‍රමාණය අදාළ කිරීමේදී හෝ වංචාවක් හෝ ඕනෑකමින්ම පැහැර හැරීමක් සිදුකර නොමැති බව කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි සනාථ කරනු ලබන්නේ නම් මිස, සාවද්‍ය වාර්තාවක් පිළියෙළ කිරීම සඳහා හෝ තම වාර්තාවෙහි දක්වා ඇති පිරිවැටුම සාවද්‍ය පිරිවැටුම් බදු අනු ප්‍රමාණයක් අදාළ කිරීම සඳහා දණ්ඩනය වශයෙන් රුපියල් දෙදහසක් නොඉක්මවන මුදලක් හා තක්සේරුවෙන් පෙන්නුම් කරන මුළු පිරිවැටුම් බද්ද සහ වාර්තාව මත ගෙවනු ලැබූ පිරිවැටුම් බද්ද අතර ඇති වෙනස මෙන් දෙගුණයකට සමාන මුදලක්ද ගෙවන ලෙස කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තාට ලියවිල්ලක් මගින් නියම කරනු ලැබිය හැකිය.

## 1X වන පරිච්ඡේදය.

## විශේෂ අවස්ථා.

අශක්‍යතාවට පත් තැනැත්තකුගේ භාරකරු.

50. යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතු යයි මේ ප්‍රඥප්තියෙන් නැතහොත් මේ ප්‍රඥප්තිය යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටුකිරීම, ඒ තැනැත්තා අශක්‍යතාවට පත් තැනැත්තකු නම්, ඒ අශක්‍ය-තාවට පත් තැනැත්තාගේ භාරකරු විසින් කරනු ලැබිය යුතු යයි නියමිත ලෙස සලකනු ලැබිය යුතුය.

හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් ප්‍රමුඛ හවුල්කරු වගකිව යුතු බව.

51. යම් තැනැත්තකු විසින් කරනු ලැබිය යුතුයයි මේ ප්‍රඥප්තියෙන් නැතහොත් මේ ප්‍රඥප්තිය යටතේ නියමිත යම් ක්‍රියාවක් හෝ දෙයක් ඉටුකිරීම, තැනැත්තන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටින හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වනවිට ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු විසින් කරනු ලැබිය යුතු යයි නියමිත ලෙස සලකනු ලැබිය යුතුය.

එසේවුවද, හවුල් ව්‍යාපාරයක ප්‍රමුඛ හවුල්කරු වශයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ දැනුම්දීමක් කරනු ලැබ ඇති යම් තැනැත්තකු ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ ක්‍රියාකාරී හවුල්කරුවෙකු නොවන බව හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් තැනැත්තකු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු වන බව හෝ සනාථ කරන්නේ නම් මිස, ඔහු ඒ හවුල් ව්‍යාපාරයේ ප්‍රමුඛ හවුල්කරු ලෙස සලකනු ලැබිය යුතුය.

සමාගමක් සම්බන්ධයෙන් වනවිට, ලේකම්, අධ්‍යක්ෂ යනාදීන් වගකිවයුතු බව.

52(1) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සෑම සමාගමක හෝ පුද්ගල මණ්ඩලයක ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ එවැනි සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබීමට නියමිත සියලු ක්‍රියා, කාරණා සහ දේවල් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතුය:

එසේවුවද, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වෙනුවෙන් මේ ප්‍රඥප්තිය යටතේ දැන්වීමක් හෝ පූ දෙනු ලැබූ යම් තැනැත්තකු ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය සමඟ තමාගේ සම්බන්ධයක් නොමැති බව හෝ ශ්‍රී ලංකාවේ සිටින අන් තැනැත්තකු එහි ප්‍රධාන නිලධරයා බව ඔප්පු කරන්නේ නම් මිස, ඔහු එහි ප්‍රධාන නිලධරයා ලෙස සලකනු ලැබිය යුතුය.

(2) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විසින් මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක ඒ වරද කරනු ලැබූ අවස්ථාවේ ඒ සමාගමේ හෝ පුද්ගල මණ්ඩලයේ ලේකම්, කළමනාකරු, අධ්‍යක්ෂ හෝ අනෙක් ප්‍රධාන නිලධරයා වශයෙන් සිටි සෑම තැනැත්තකුම ඒ වරද කර ඇත්තේ තමාගේ අනුදැනුම නොමැති බව සහ එම තනතුරේ තම කර්තව්‍යවල ස්වභාවය සහ යෙදී ඇති වෙනත් සියලු කරුණු ගැන සැලකිලිමත්ව එම වරද කිරීම වැළැක්වීමට ක්‍රියාකළ යුතුවූ පරිදි සියලු උද්‍යෝගයෙන් තමා ක්‍රියා කළ බව ඔප්පු කරනහොත් මිස, ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

අනුයෝජිතයා සහ ප්‍රධානියා සතු වගකීම.

53. පිරිවැටුම් බද්දක් ගෙවිය යුතු යම් ව්‍යාපාරයක් යම් තැනැත්තකු විසින් යම් වෙනත් තැනැත්තකු වෙනුවෙන් ඒ වෙනත් තැනැත්තාගේ අනුයෝජක වශයෙන් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් මෙහි පසුව සඳහන් කළ තැනැත්තාගෙන් අයකළ යුතුව තිබුණු ආකාරයටම සහ ප්‍රමාණයටම වූ පිරිවැටුම් බද්දක් පළමුව සඳහන් කළ තැනැත්තාගෙන් අයකර ගත යුතුය.

භාරයක භාරකරුවන් හෝ මියගිය තැනැත්තකුගේ පොල්මං කරුවන් ඒකාබද්ධව යටත්වන බව.

54. තැනැත්තන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් භාරයක භාරකරුවන්ගේ තත්ත්වයෙන් හෝ මියගිය තැනැත්තකුගේ මුදලයේ පොල්මං කරුවන්ගේ තත්ත්වයෙන් හෝ ක්‍රියා කරන අවස්ථාවක, මේ ප්‍රඥප්තිය යටතේ ඔවුන්ගෙන් අයකළ හැකි වන පිරිවැටුම් බද්ද ඒකාබද්ධව හා වෙන් වෙන් වශයෙන් ඔවුන්ගෙන් අයකරනු ලැබිය හැකිවන අතර, ඒ බද්ද ඒකාබද්ධව හා වෙන් වෙන් වශයෙන් ගෙවීමට ඔව්හු යටත් වෙති.

සමාගමක් ඈවර කිරීමේදී අධ්‍යක්ෂවරුන් වගකිව- යුතු බව.

55. (1) සමාගම් ආඥාපනතේ කුමක් සඳහන් වුවද, සමාගමක් ඈවර කර වසා දමන අවස්ථාවකදී, ඒ සමාගම විසින් ගෙවිය යුතුවූ යම් පිරිවැටුම් බද්දක් අයකර ගත නොහැකිවූ විටක, බද්ද අයකරනු ලබන්නේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන්ද, ඒ කාලසීමාව තුළ යම් කාලයක් සඳහා සමාගමේ අධ්‍යක්ෂවරයෙකුව සිටි සෑම තැනැත්තකුම, බද්ද ගෙවීම පැහැර හැරීම, සමාගමේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ යම් දැඩි නොසැලකිල්ලක්-

ව්‍යතික්‍රමයක් හෝ යුතුකම් පැහැර හැරීමක් නිසා නොවන බව ඔහු විසින් විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, ඒ බද්ද ගෙවීම සම්බන්ධයෙන් ඒකාබද්ධව හා තනිතනිව වගකිවයුතු වන අතර, පිරිවැටුම් බද්ද එකතුකර ගැනීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන ඒ අනුව අදාළ වියයුතුය.

(2) පුද්ගල මණ්ඩලයක් විසුරුවාහරිනු ලබන අවස්ථාවකදී ඒ පුද්ගල මණ්ඩලය විසින් ගෙවිය යුතුවූ යම් පිරිවැටුම් බද්දක් අයකර ගත නොහැකිවූ විටක බද්ද අයකරනු ලබන්නේ යම් කාලසීමාවක් සම්බන්ධයෙන්ද ඒ කාලසීමාව තුළ ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයෙකුවූ සෑම තැනැත්තකුම බද්ද ගෙවීම පැහැරහැරීම ඒ මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් තමාගේ යම් දැඩි නොසැලකිල්ලක් ව්‍යතිරේඛ ව්‍යතික්‍රමයක් හෝ යුතුකම් පැහැර හැරීමක් නිසා නොවන බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් මිස, ඒ බද්ද ගෙවීම සම්බන්ධයෙන් ඒකාබද්ධව හා තනි තනිව වගකිව යුතුවන අතර, පිරිවැටුම් බද්ද එකතුකර ගැනීම හා අයකර ගැනීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධාන ඒ අනුව අදාළවිය යුතුය.

ව්‍යාපාරය අවසන්වන අවස්ථාවේදී පිරිවැටුම්බද්ද ගෙවීමේ වගකීම.

56. (1) පිරිවැටුම්බද්ද අයකරනු ලැබිය හැකිවූ තැනැත්තකු, ඒ බද්ද අයකළ හැකි වනුයේ යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන්ද ඒ ව්‍යාපාරය යම් කාර්තුවක් සඳහා පැවැති යන අතර අවසන් කරන අවස්ථාවක, ඒ ව්‍යාපාරය පවත්වාගෙන යාම ඔහු විසින් අවසන් කරනු ලැබ තිබුණද , ඒ කාර්තුව තුළදී ඔහු ඒ ව්‍යාපාරය පවත්වාගෙන ගිය කාලසීමාව සඳහා මෙහි මින්මතු සලස්වා ඇති විධිවිධානවලට යටත්ව, ඒ බද්ද ගෙවීමට ඔහු බැඳී සිටින්නේය.

(2) යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් තැනැත්තකු විසින් ඒ ව්‍යාපාරය වෙනත් යම් තැනැත්තකු වෙත පවරනු ලබන අවස්ථාවක ඒ පැවරුමට පෙරාතුවවූ කාලසීමාව සඳහා ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ගෙවිය යුතුවූ පිරිවැටුම් බද්ද පැවරුම්කරුගෙන් අයකරගත නොහැකි නම් පැවරුම්ලාභී වෙත තක්සේරුවක් කරනු ලැබ නොතිබුණද, පැවරුම්ලාභීන්ගෙන් එය අයකරගත හැකි වන අතර, පිරිවැටුම් බද්ද එකතුකිරීම හෝ -

ලබාගැනීම සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ඒ අනුව අදාළවිය යුතුය.

තැනැත්තකු මියගිය විට පිරිවැටුම් බද්ද ගෙවීමට පොල්මංකරුවන් යටත්බව.

57. පිරිවැටුම් බද්ද අයකළ හැකිවූ යම් තැනැත්තකු මියගිය අවස්ථාවක ඒ තැනැත්තාගේ මරණය සිදුවීමට පෙරාතුව වූ සියලුම කාලසීමාවන් සම්බන්ධයෙන් ඒ තැනැත්තා ජීවත්ව සිටියේ නම්, ඔහුගෙන් අයකළ හැකිවූ පිරිවැටුම් බද්ද ඒ තැනැත්තාගේ පොල්මංකරුගෙන් අය-කරනු ලැබිය යුතු වන අතර, ඒ මියගිය තැනැත්තා ජීවත්ව සිටියේ නම් මේ ප්‍රඥප්තිය යටතේ වගකිවයුතු වූ සියලු ක්‍රියා , කාරණා හා දේවල් සම්බන්ධයෙන් ඒ පොල්මංකරු වගකිව යුතුය.

එසේ වුවද, -

(අ) මියගිය තැනැත්තාගේ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සම්බන්ධයෙන් පොල්මංකරුට විරුද්ධව කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතුය.

(ආ) ඒ තැනැත්තාගේ මරණය සිදුවී දිනයට පෙරාතුව වූ කාල පරිච්ඡේදයන් සම්බන්ධයෙන් කිසිදු තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් මරණය සිදුවූ කාර්තුවේ අවසානයේ සිට තුන් අවුරුද්දකට පසුව, කරනු නොලැබිය යුතුය; තවද,

(ඇ) මේ වගන්තිය යටතේ පොල්මංකරුගේවගකීම -

(1) මේ වගන්තිය යටතේ පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් බැඳීම් පැන නඟින බවට පොල්මංකරුට දැන්වීම දෙනුලබන දිනය වනවිට ඔහු බන්තකයෙහි හෝ ඔහුගේ පාලනයෙහි පැවති මියගිය තැනැත්තාගේ මුදලයේ ප්‍රමාණයට ; සහ

(11) අර්ථලාභියෙකු අතට පත්ව තිබිය හැකි ඒ මුදලයේ යම් කොටසකට ප්‍රමාණයට සීමා විය යුතුය.

(2) පොල්මංකරුවෙකු විසින් මියගිය තැනැත්තකුගේ බූදලය වෙනුවෙන් ඒ බූදලයේ කොටසක් වන යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන අවස්ථාවක ඒ මියගිය තැනැත්තා ජීවත්ව සිටියේ නම්, ඔහුගෙන් අයකරගත හැකිව තිබුණු පිරිවැටුම් බද්ද, ඒ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඒ පොල්මංකරුගෙන් අයකර ගනු ලැබිය යුතුය.

ඇතැම් අවස්ථාවලදී තක්සේරුකරු විසින් තම අභිමතය පාවිච්චි කළහැකි බව.

58. යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙහි ප්‍රමාණය අඩුකරන්නාවූ හෝ අඩුකිරීමේ ප්‍රතිඵලය ගෙන දෙනු ලැබිය හැකි යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් කෘත්‍රිමබව හෝ ව්‍යාජබව යහ යම් ගනුදෙනුවක් හෝ බැහැර කිරීමක් ඇත්ත වශයෙන්ම, ක්‍රියාත්මක කරනු නොලබන බව තක්සේරුකරුගේ මතය වන අවස්ථාවක, එවැනි යම් ගනුදෙනුවක් හෝ පබැහැර කිරීමක් ඔහු විසින් නොසලකා හැරිය හැකි අතර, ඒ අනුව ඒ ගනුදෙනුවට හෝ බැහැර කිරීමට අදාළ පාර්ශ්වයයන් තක්සේරු කළ හැකිය.

මේ වගන්තියෙහි "බැහැර කිරීම" යන්නට යම් භාරයක්, ප්‍රදානයක් ප්‍රතිඥාවක්, ගිවිසුමක් හෝ සැකැස්මක් ඇතුළත් වේ.

X වන පරිච්ඡේදය.

බදු අයකර ගැනීම.

59. (1) 29 වන වගන්තියේ 30 වන වගන්තියේ, 31 වන වගන්තියේ 32 වන වගන්තියේ, 33 වන වගන්තියේ, 34 වන වගන්තියේ, 35 වන වගන්තියේ හා 36 වන වගන්තියේ කාර්යය සඳහා "පිරිවැටුම් බද්ද" යන්නට මෙපනත යටතේ පනවන ලද හෝ දඬුවම් දරවාලද යම් දණ්ඩනයක් ඇතුළත් වේ.

(2) 31 වන වගන්තිය හෝ 32 වන වගන්තිය යටතේ සහතිකයක් හෝ 34 වන වගන්තිය යටතේ දැන්වීමක් කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන කවර හෝ අවස්ථාවක, පැහැර හැරිය තැනැත්තා වෙත ඒ වේලාවෙහිම ඒ පිළිබඳ නිවේදනයක්, පෞද්ගලිකව භාර කිරීමෙන් හෝ තැපෑලෙන් යවනු ලබන ලියාපදිංචි කළ ලිපියකින් හෝ විදුලි පුවතක් මගින් හෝ නිකුත් කළයුතුය. එසේ පැහැර හැරිය තැනැත්තාට ඒ -

නිවේදනය නොලැබීම මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු බලරහිත වීමට හේතුවක් නොවන්නේය.

පිරිවැටුම්බද්ද ප්‍රථම වැයබරක් වියයුතු බව.

60. ගෙවීම් පැහැර හරිනු ලැබූ යම් පිරිවැටුම් බද්දක් එය පැහැර හරින්නාගේ සියලු වත්කම් විෂයයෙහි ප්‍රථම වැයබරක් වියයුතුය.

එසේ වුවද–

(1) 34 වන වගන්තියේ විධිවිධානවලට අනුව තක්සේරු කරනු ලැබීමට පෙර, පැහැර හරින්නා විසින් වටිනාකම සඳහා සද්භාවයෙන් මිලදීගන්නකුට විකුණන ලද යම් වත්කම්වලට ඒ වැය බර ව්‍යාප්ත නොවිය යුතුය. නැතහොත් බල නොපෑ යුතුය.

(11) නිශ්චල දේපල සම්බන්ධයෙන් වූ විට, දේපල තහනම් කරනු ලැබූ දිනයට පෙර, වටිනාකම සඳහා සද්භාවයෙන් ඇති කරන ලදුව, ලියාපදිංචි කරනලද බද්ධකරයකට හෝ බැඳීමකට වැඩි ප්‍රමුඛත්වයක් පිරිවැටුම් බද්දට නොලැබිය යුතුය; තවද,

(111) චංචල දේපළ සම්බන්ධයෙන්වූ විට, කාර්තු සතරක කාලයක් සඳහා පරිවැටුම් බදු නොගෙවා පැහැර හැර තිබෙන අවස්ථාවක කොමසාරිස්වරයා විසින් තෝරාගත යුතු කාර්තු සතරක් පමණක් සඳහාවූ බදුවලට පැහැර හැරීමේ දිනයට පෙර වටිනාකම සඳහා සද්භාවයෙන් ඇතිකර ගනු ලැබූ යම් කැප අයිතියකට හෝ බැඳීමකට වඩා වැඩි ප්‍රමුඛත්වයක් ලැබිය යුතුය.

පැහැරහරින්නා වෙත කරනු ලබන දැන්වීම.

61 (1) යම් පිරිවැටුම් බද්දක් ගෙවීම පැහැර හැර තිබෙන අවස්ථාවක කොමසාරිස්වරයා විසින් ඒ බද්ද අයකර ගැනීමට කටයුතු කිරීමට පෙර –

(අ) ඒ බද්දේ විස්තර ; සහ

(ආ) ඒ බද්ද අයකර ගැනීමට කටයුතු කිරීමට අදහස් කරන බව සඳහන් කරමින් පැහැර හරින්නා වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් නිකුත් කරනු ලැබිය යුතුය.

(2) පැහැර හරිනු ලැබ ඇති පිරිවැටුම් බද්ද වූ හලි පැහැර හරින්නා මත කරගලද තක්සේරුවක් සම්බන්ධයෙන් වුවත් නම්, සහ පැහැර හරින්නා විසින් ඒ තක්සේරුවට විරුද්ධව වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති නම්, හෝ පැහැර හරින්නා විසින් සපයන ලද වාර්තාවකට අනුකූලව ගෙවියයුතු යම් මුදලක් සම්බන්ධයෙන් වුවත් නම්, පැහැර හරින්නා විසින් ඒ දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත, අයකරනු ලැබූ බද්ද සම්බන්ධයෙන් කොමසාරිස්වරයා වෙත විරෝධතාවක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. තවද, 48 වන වගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් වුවද, කොමසාරිස්වරයා විසින් එවිරෝධතා සලකාබලා ඒ පිළිබඳව ස්වකීය තීරණය දෙනු ලැබියයුතු අතර, ඒ තීරණය අවසානාත්මක වන්නේය.

[illegible]
[illegible]
පිරිවැටුම්බද්ද
අයකරගැනීම.

62 (1) කොමසාරිස්වරයා විසින්, මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා, බදු එකතු කරන්නන් ලෙස තැනැත්තන් පත්කරනු ලැබිය හැකිය.

(2) (අ) යම් පිරිවැටුම් බද්දක් නොගෙවා පැහැර හැර ඇති අවස්ථාවක, ඒ බද්ද පිළිබඳ විස්තරද පැහැර හැර ඇති තැනැත්තාගේ නමද ඇතුළත් සහතිකයක් උපදිසාපතිවරයෙකු වෙත හෝ පිස්කල්වරයකු වෙතහෝ නියෝජ්‍ය පිස්කල්වරයෙකු වෙත හෝ බදු එකතු කරන්නෙකු වෙත කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකිය. ඒ සහතිකයෙහි නම් කරනු ලැබූ පැහැරහැරි තැනැත්තාගේ චංචල දේපොළ තහනම්කොට විකිණීමෙන් ඒ තැනැත්තාගේ බද්ද අයකර ගැනීමට සැලැස්වීමට ඒ සහතිකය නිකුත් කරනු ලැබූ නිලධරයාට බලය ලැබියයුතුවත් හැර , එසේ අයකරන ලෙස ඒ නිලධාරියාට මෙයින් නියම කරනු ලැබේ.

(ආ) ඉතාමත් යෝග්‍යයැයි එකී නිලධරයා කල්පනා කරන ආකාරයට එකී තහනම සිදුකළ යුතු අතර, එලෙස තහනමට ගත් දේපළ පැහැර හැරිය තැනැත්තා විසින් වියදම් හා ගාස්තු ගෙවනු ලැබීමට යටත්ව, දින පහක කාලයක් තබාගත යුතුය. පැහැර හැරිය තැනැත්තා විසින් නොගෙවා පැහැර හරිනු ලැබූ බද්ද එකී දින පහ –

ඇතුළත ගාස්තු සහ වියදම්ද සමඟ නොගෙවුවහොත්, උපදියාපති වරයා, පිස්කල්, නියෝජ්‍ය පිස්කල් හෝ බදු එකතුකරන්නා විසින් ඒ දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට සැලැස්විය යුතුය.

(ඇ) එම විකිණීමෙන් ලැබෙන මුදල් -

(1) පළමුව දේපළ තහනම් කිරීමේ, තබාගැනීමේ හා විකිණීමේ ගාස්තු හා වියදම් පියවීම සඳහාද,

(11) දෙවනුව, නොගෙවා ශේෂයක් වේනොත් එය, තහනම් කරනු ලැබූ දේපළෙහි අයිතිකරුට ගෙවිය යුතුය.

(3) තහනමට ගැනීම ක්‍රියාත්මක කරනු නොලැබුවද, මේ වගන්තිය යටතේ පැහැර හරින්නකුට විරුද්ධව ක්‍රියා කිරීමේදී බදු එකතුකරන්නකු විසින් දරන ලද යුක්තිසහගත වියදම්, යහු විසින් යම් පැහැරහරින්නකුගෙන් අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේය. මුදල් තහනමට ගනු ලැබූ අවස්ථාවක , එවැනි යුක්තියසහගත වියදම්එයේ තහනමට ගනු ලැබූ මුදලින් පළමුව පියවී කරගනු ලැබිය යුතුය.

(4) යම් පිරිවැටුම් බද්දක් නොගෙවා පැහැර හැර ඇත්තාවූද, (2)වන උප වගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට එය අයකර ගැනීම කළ නොහැකි බව හෝ යෝග්‍ය නොවන බව කොමසාරිස්වරයාගේ මතය වන්නාවූද, අවස්ථාවක ගෙවීම පැහැර හැරිය තැනැත්තා පදිංචිව සිටින හෝ පැහැර හැරි තැනැත්තාට අයත් චංචල හෝ නිශ්චල දේපලක් හෝ යම් දිස්ත්‍රික්කයක් විෂයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයකට ඒ බද්දේ විස්තරද ඒ බද්ද ගෙවිය යුත්තේ යම් තැනැත්තකු හෝ තැනැත්තන් හෝ විසින්ද ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ හෝ නම හැකහොත් නම්ද ඇතුළත් සහතිකයක් කොමසාරිස්වරයා විසින් නිකුත් කළහැකිය. එවිට ඒ අධිකරණය විසින්, ගෙවීම පැහැර හැරිය තැනැත්තාගේ චංචල හා නිශ්චල දේපළ සියල්ලම හෝ ඉන් යමක් හෝ පැහැර හැරිය බද්ද අයකර ගැනීම පිණිස අවශ්‍ය යැයි පිස්කල් සලකන -

ඉන් යම් කොටසක් හෝ තහනම් කොට විකිණීමට බලය දෙන හා නියමකරන රිට් ආඥාවක් පිස්කල් වෙත නිකුත් කිරීමට විධාන කළයුතුය. තවද, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 වන වගන්තියේ සිට 297 වන වගන්තිය තෙක්වූ වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, ඒ තහනම් කිරීමට හා විකිණීමට අදාළවිය යුතුය.

මේ වගන්තියේ කාර්ය සඳහා "චංචල දේපල" යන්නට පිරියත සහ යන්ත්‍ර ඇතුළත් වන්නේය.

අයකරගැනීම සඳහා මහේස්ත්‍රාත් වරයා ඉදිරියේ පෙන්වන [illegible] කාරය.

63. නොගෙවා පැහැර හැරිය බද්ද තහනම් කොට විකිණීමෙන් අයකර ගැනීම කළ නොහැකි බව හෝ ප්‍රායෝගික නොවන බව හෝ කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක හැතහොත් තහනම් කොට විකිණීමෙන් සම්පූර්ණ මුදල අයකරගනු නොලැබූ අවස්ථාවක ඒ බද්දේ විස්තරද පැහැර හැරිය තැනැත්තාගේ නම සහ අන්තිමට දැන සිටි ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානයද දැක්වෙන සහතිකයක් ඒ ස්ථානය පිහිටි කොට්ඨාශය විෂයයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත කොමසාරිස්වරයා විසින් නිකුත් කළ හැකිය. එවිට මහේස්ත්‍රාත්වරයා විසින් බද්ද අයකර ගැනීම සඳහා ගෙවීම පැහැර හැරිය තැනැත්තාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්විය යුත්තේ මන්ද යන්නට කරුණු දැක්වීමට ඔහු කමා ඉදිරියට කැඳවිය යුතුය. ප්‍රමාණවත් හේතු නොපෙන්වුවහොත් නොගෙවා පැහැර හැරිය බද්ද, දඩයකින් පමණක් දඬුවම් කළයුතු හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් නොකළ යුතු වරදක් සම්බන්ධයෙන් ඒ පැහැර හැරිය තැනැත්තාට ඒමහේස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දණ්ඩනයක් මගින් පනවනු ලැබූ දඩයක් ලෙස සැලකිය යුතු අතර, එවිට එවැනි වරදක් සඳහා නියම කරගලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක. 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උප වගන්තියේ විධිවිධාන(එහි) (අ) සහ (එ) ඡේදවල විධිවිධාන හැර) අදාළ වියයුතුය. ඒ දණ්ඩන නියමය කරන වේලාවෙහි ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මහේස්ත්‍රාත් වරයා විසින් කළ හැකි වූ විධානයක් ඔහු විසින් කළ හැකිය.

ශ්‍රී ලංකාවෙන් බැහැරයන තැනැත්තන්ගෙන් පිරිවැටුම්බදු අයකරගැනීම.

64. යම් තැනැත්තකු විසින් ගෙවියයුතු පිරිවැටුම් බදු නොගෙවා ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් බැහැර යාමට ආසන්න බව හෝ එසේ බැහැර යාමට ඉඩ ඇති බව හෝ කොමසාරිස්වරයාගේ මතය වූ අවස්ථාවක එකී බද්දේ විස්තරද ඒ තැනැත්තාගේ නමද අඩංගු සහතිකයක් කොමසාරිස්වරයා විසින් මහේස්ත්‍රාත්වරයෙකු වෙත නිකුත් කරනු ලැබිය හැකිය. ඒ මහේස්ත්‍රාත්වරයා වෙත, එය ලැබුණුවිට, බදු ගෙවීම හෝ එය ගෙවීම සඳහා කොමසාරිස්වරයා සෑහීමකට පත්වන ආකාරයට ඇප තැබීම හෝ නොකර ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන්බැහැරයාම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමට විධානයක් ඒ මහේස්ත්‍රාත්වරයා විසින් පොලිස්පතිවරයා වෙත නිකුත්කරනු ලැබිය යුතුය.

ණය ආදියෙන් පිරිවැටුම්බද්ද අයකර ගැනීම.

65. යම් තැනැත්තෙකු විසින් ගෙවියයුතු පිරිවැටුම් බද්ද නොගෙවා පැහැර හැර ඇත්තාවූද -

(අ) යම් තැනැත්තකු පැහැර හරින්නාට හෝ ඔහුගේ අනුයෝජිතයාට ණයගැතිව සිටීමේ හෝ ඔහුට මුදල් ගෙවීමට සූදානම්ව සිටීමේ ශක්‍යතාවයක් ඇති බව ; හෝ,

(ආ) යම් තැනැත්තකු පැහැර හරින්නා හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ සඳහා තැනැත්තෙක් ඔහු වෙනුවෙන් මුදල් තබාගෙන සිටීමේ ශක්‍යතාවක් ඇති බව ; හෝ,

(ඇ) පැහැර හරින්නාට හෝ ඔහුගේ අනුයෝජිතයාට ගෙවීම සඳහා වෙනයම් තැනැත්තකු වෙනුවෙන් යම් තැනැත්තකු මුදල් තබාගෙන සිටීමේ ශක්‍යතාවක් ඇතිබව ; හෝ

(ඈ) පැහැර හරින්නාට හෝ ඔහුගේ අනුයෝජිතයාට මුදල් ගෙවීමට යම් තැනැත්තකු අන්කිසි තැනැත්තකුගේ බලය ලබා සිටීමේ ශක්‍යතාවක් ඇති බව.

කොමසාරිස්වරයාට පෙනීයන්නාවූද, අවස්ථාවක නොගෙවා පැහැර හැරිය මුදල් ප්‍රමාණයට වඩා වැඩි නොවන මුදලක් දැන්වීමේ නම්කරනු ලැබූ නිලධරයාට ගෙවන ලෙස නියම කරන (පැහැර හරින්නා වෙත පිටපතක් -

තැපෑලෙන් යැවිය යුතුය.) ලියවිල්ලකින් වූ දැන්වීමක් ඒ තැනැත්තාට කොමසාරිස්වරයා විසින් දිය හැකිය. ඒ දැන්වීම ලැබූ දිනයෙහිදී ඔහු අතෙහි ඇති හෝ ඔහුගෙන් අයවියයුතු හෝ මුදල්වලටද දැන්ව දැන්වීමේ දිනට පසු මාසතුනක කාලයක් ඇතුළත යම් අවස්ථාවක ඔහු අතට පත්වන හෝ ඔහුගෙන් අයවියයුතු හෝ ඔහු විසින් ගෙවීමට සූදානම් වන හෝ සියලු මුදල්වලටද ඒ දැන්වීම අදාළ වියයුතුය.

බදු අයකරගැනීමේ ක්‍රම එකකට වැඩි ගණනක් ප්‍රයෝජනයට ගැනීම.

66. මේ ප්‍රඥප්තිය යටතේ යම් තැනැත්තකුගෙන් අයවියයුතු සම්පූර්ණ පිරිවැටුම් බද්ද මේ ප්‍රඥප්තියේ සලසා ඇති විධිවිධාන යටතේ අයකර ගත නොහැකි බව හෝ නොහැකි වියහැකි බව හෝ කොමසාරිස්වරයාගේ මතය වූ අවස්ථාවක ඒ තැනැත්තා සම්බන්ධයෙන් 63 වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරයකු විසින් ආඥාවක් කර එය ක්‍රියාත්මක කර තිබුණද, ඒ නොතකා එසේනොගෙවා ඉතිරිව ඇති යම් මුදලක් අයකර ගැනීම සඳහා මේ පනතේ විධිවිධාන සලස්වනු ලැබූ බදු අයකර ගැනීමේ වෙනත් යම් මාර්ගයක් කොමසාරිස්වරයා විසින් අනුගමනය කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය.

පිරිවැටුම් බදු අයකරගැනීම සඳහා තොරතුරු ලබාගැනීම පිළිබඳ කොමසාරිස්වරයාගේ බලතල.

67. යම් තැනැත්තකුගෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් හෝ අයවිය යුතු පිරිවැටුම් බද්ද අයකර ගැනීමේ කාර්ය සඳහා කොමසාරිස්වරයාට අවශ්‍ය වන යම් තොරතුරක් , කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තා වෙත දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ සඳහන් කර ඇති කාලය ඇතුළත තමා වෙත සපයන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය.

[illegible]

68. (1) මේ පරිච්ඡේදයෙන් කොමසාරිස්වරයා වෙත පිරිනැමුණු හෝ පැවරුණු බලතල හෝ කර්තව්‍ය කිසිවක් කොමසාරිස්වරයා විසින් තමාගේ අත්සන යටතේවූ ලියවිල්ලකින් යම් තක්සේරුකරුවෙකු වෙත පවරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ බලතල හෝ කර්තව්‍ය කිසිවක් පවරනු ලැබූ සෑම තක්සේරුකරුවෙකු විසින්ම ඒ බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම කොමසාරිස්වරයාගේ සාමාන්‍ය මහා විශේෂ විධානවලට යටත්ව කරනු ලැබිය යුතුය.

දැන්වීම් අත්සන් කිරීම හා භාරදීම.

69. (1) මේ ප්‍රඥප්තිය යටතේ කොමසාරිස් විසින් නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් හෝ තක්සේරුකරුවෙකු විසින් දියයුතු සෑම දැන්වීමකම අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස්වරයාගේ හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ හෝ නම තිබිය යුතු අතර, එවැනි සෑම දැන්වීමක්ම කොමසාරිස්වරයාගේ නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ හෝ තක්සේරුකරුගේ නම එහි නිසි පරිදි මුද්‍රණය කර හෝ අත්සන් කර තිබුණොත් වලංගු විය යුතුය.

(2) මේ ප්‍රඥප්තිය ප්‍රකාර දෙනු ලබන සෑම දැන්වීමක්ම, පුද්ගලිකව භාරදීමෙන් හෝ, යම් තැනැත්තකුගේ අන්තිමට දැන සිටි වාසස්ථානයට නැතහොත් දැන්වීම අදාලවන අවුරුද්ද ඇතුලත ඔහු ව්‍යාපාරයේ නියුක්තව සිටි හෝ සිටින ස්ථානයට භාරදීමෙන් නැතහොත් තැපෑලෙන් යැවීමෙන් හෝ ඔහු වෙත භාරදිය හැකිය.

එසේවුවද, 42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය යටතේ වූ තක්සේරු කිරීමේ දැන්වීමක් පුද්ගලිකව හෝ ඉහත සඳහන් කරනු ලැබූ යම් ස්ථානයකට ලියාපදිංචි කළ ලිපියක මාර්ගයෙන් තැපෑලෙන් යැවීමෙන් භාරදිය යුතුය.

(3) තැපෑලෙන් යවනු ලැබූ දැන්වීමක් තැපෑලට ගතවන සාමාන්‍ය කාලය අනුව එය ලැබිය යුතු දිනයෙහි භාරදෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

(4) තැපෑලෙන් භාරදීම ඔප්පු කිරීමේදී, දැන්වීම ඇතුලත් ලිපිය යථා පරිදි ලියා තැපැල් කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් වියයුතුය.

(5) මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහාවූ යම් දැන්වීමක් හෝ සහතිකයක් හෝ දීමට නැතහොත් නිකුත් කිරීමට බලය ඇති තැනැත්තාගේ නමයයි සලකනු ලැබිය යුතු නමක් එවැනි යම් දැන්වීමක මුද්‍රණය කර හෝ -

අත්සන් කර හෝ තිබේද? නැතහොත් එවැනි යම් සහතිකයක අත්සන් කර තිබේද ඒ යැම නමක්ම අධිකරණමය වශයෙන් පිළිගනු ලැබිය යුතුද?

70. මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලයයි අදහස් කරනු ලබන යම් දැන්වීමක්, තක්සේරුවක්, සහතිකයක් හෝ වෙනත් කටයුත්තක් එහි සාරය හා බලපෑම අනුව මේ පනතේ අධ්‍යාශයට හා අර්ථයට අනුකූල වේනම්, හෝ ගැලපේනම් සහ එමගින් තක්සේරු කරනු ලැබූ හෝ තක්සේරු කිරීමට අදහස් කරනු ලැබූ හෝ බලපෑමක් ඇතිවී තිබෙන්නාවූ හෝ තැනැත්තා පොදු අධ්‍යාශයට සහ වැටහීමට අනුව එහි නම්කර තිබේ නම්, එහි ආකෘතියේ ඌනතාවක් හේතුවෙන් නිෂ්ප්‍රභ කරනු ලැබීම හෝ ශූන්‍යලෙස හෝ ශූන්‍ය කළ හැකි ලෙස හෝ සලකනු ලැබීම හෝ නොකළයුතු අතර, එහි ඇති යම් වරදකින්, දෝෂයකින් හෝ අඩුපාඩුවකින් ඒ කිසිවක් කෙරෙහි බලපෑමක් නොසිදුවිය යුතුය.

(2) යම් තක්සේරුවක් පිළිබඳ දැන්වීම ආදායම් බදු අයකරගැනීම අපේක්ෂා කරනු ලැබූ තැනැත්තා වෙත යථා පරිදි භාරදී ඇත්නම්, සහ මේ උප වගන්තියේ (අ) ඡේදයේ සඳහන් විස්තරවල සාරය හා බලපෑම ඒ දැන්වීමේ ඇත්නම්, (1) වන උප වගන්තියේ ව්‍යාප්තියට හානියක් නොමැතිව යම් තක්සේරුවක -

(අ) බදු අයකරනු ලැබීමටයටත් තැනැත්තාගේ නම හෝ පෙළපත්නාමය පිළිබඳව හෝ පිරිවැටුම් ප්‍රමාණය පිළිබඳව හෝ අයකරනු ලැබූ පිරිවැටුම්බදු ප්‍රමාණය පිළිබඳව හෝ වරදක් කිරීම; හෝ

(ආ) තක්සේරුව හා ඒ පිළිබඳව දැන්වීම අතර යම් වෙනයක් තිබීම ඒ තක්සේරුව කෙරෙහි බල නොපෑ යුතු අතර, එකී හේතුවක් මත ඊට විරුද්ධ නොවිය යුතුය.

71. කොමසාරිස්වරයා විසින් ඒ සඳහා විශේෂයෙන් බලය දෙනුලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින්, සාම නිලධරයකු සමග ගොස් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටුකළ හැකිය.

(අ) මේ පනත යටතේ වූ යම් තවයුත්තක් සඳහා ප්‍රයෝජන වන්නේ යයි හෝ තවයුත්තකට අදාළ වන්නේ යයි ඔහු අදහස් කරන යම් ගිණුම් පොත්, ලේඛන, වාර්තා හෝ වෙනත් ලියකියවිලි ඇතැයි විශ්වාස කිරීමට ඔහුට හේතු ඇත්නම් ගොඩනැගිල්ලකට හෝ ස්ථානයකට ඇතුළුවීම හා සෝදිසි කිරීම සහ ඒවා සොයා ගනු ලැබුවහොත් ඒවා පරීක්ෂා කිරීම;

(ආ) එවැනි ගිණුම් පොත්, ලේඛන වාර්තා හෝ වෙනත් ලියකියවිලි භාරයට ගැනීම හෝ එවා හඳුනා ගැනීමේ ලකුණු තැබීම හෝ එවායේ උධෘත හෝ පිටපත් ගැනීම ;

(ඇ) මේ වගන්තිය යටතේ යම් සෝදිසියක් කිරීමේ දී සොයා ගනු ලැබූ මේ පනත යටතේ වූ යම් තවයුත්තකට ප්‍රයෝජනවත් වන්නේ යයි හෝ අදාළ වීතහේ යයි ඔහුට අදහස් වන, යම් දෙයක සටහනක් හෝ දේපළ ලැයිස්තුවක් සෑදීම.

තවද, 1970 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි ඇති සෝදිසි කිරීම් වලට අදාළ වූ විධිවිධාන මේ වගන්තිය යටතේ වූ සෝදිසි කිරීම් වලට අදාල විය හැකිතාක් දුරට අදාළ විය යුතුය.

(2) (1) වන උප වගන්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමට යම් නිලධරයකුට බලය දීමට පෙර, ඒ නිලධරයා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීම අවශ්‍යවූයේ ඇයි නිසා/දැයි කොමසාරිස්වරයා විසින් සටහන් කරනු ලැබිය යුතුය.

(3) (1) වන උප වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් යම් ගිණුම් පොත්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් යම් තැනැත්තකුගේ භාරයට ගනු ලබන අවස්ථාවක එම නිලධරයා විසින් භාරයට ගනු ලැබ ඇති ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල නිශ්චිත වශයෙන් සඳහන් කෙරෙන සටහනක් ඒ තැනැත්තා වෙත භාර දිය යුතුය.

(4) යම් නිලධරයකු විසින් (1) වන උප වගන්තිය යටතේ තමාහට ගනු ලැබූ යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් පරීක්ෂා කිරීම සඳහා හෝ ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල අයත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු පැවරීම සඳහා හෝ අවශ්‍ය විය හැකි තාක් කල් ඒ පොත, ලේඛනය, වාර්තාව හෝ වෙනත් ලියවිල්ල ඒ නිලධරයා ස්වභාරයෙහි රඳවා තබා ගනු ලැබිය හැකි ය.

72. කොමසාරිස්වරයා විසින් හෝ, කොමසාරිස්වරයා විසින් ඒ සඳහා ලියවිල්ලකින් විශේෂයෙන් බලය දෙනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකු විසින් පහත සඳහන් ක්‍රියා සියල්ලම හෝ ඉන් කිසිවක් ඉටු කළ හැකිය.:-

(අ) මෙම පනතේ විධිවිධාන පිළිපදිනු ලැබ තිබේදැයි නිර්ණය කිරීමේ කාර්යය සඳහා යම් තැනැත්තකු විසින් යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් ස්ථානයකට හෝ ගොඩනැගිල්ලකට ඇතුළුවීම සහ පිරික්සීම ;

(ආ) යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් සොයා ගනු ලැබිය හැකි යම් ස්ථානයක් විවෘත කිරීම සහ පරීක්ෂා කිරීම සහ එහි දී සොයා ගනු ලබන යම් භාණ්ඩ පිළිබඳ දේපළ ලැයිස්තුවක් සෑදීම ;

පිරිවැටුම් බද්ද අය කළ හැකි සෑම තැනැත්තකු විසින්ම වවුචරය පිළියෙල කොට නිකුත් කළ යුතු බව.

73. පිරිවැටුම් බද්ද අය කළ හැකි සෑම තැනැත්තකු විසින් ම, තම ව්‍යාපාරය පවත්වා ගෙන යාමේ දී තමා එළඹුණු 47 වන වගන්තියේ (2) වන උප වගන්තියේ සඳහන් ගනුදෙනුවක් නොවන එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් ;

(අ) ඒ ගනුදෙනුවට එළඹුණු දිනය ;

(ආ) ඒ ගනුදෙනුවේ ස්වභාවය ;

(ඇ) ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් ලැබුණු හෝ ලැබිය හැකි මුදල් ප්‍රමාණය සහ

(ඈ) ඒ ගනුදෙනුවට ඇතුළත් වූයේ යම් තැනැත්තකු සමග ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය .

දක්වමින් වවුචරයක් පිළියෙළ කිරීම හෝ පිළියෙළ කිරීමට සැලැස්වීම හෝ කළයුතුය. ඒ ගණුදෙනුවට එළඹුනේ යම්කිසි තැනැත්තෙකු සමඟද, ඒ තැනැත්තාට ඒ වවුචරයේ මුල් පිටපත නිකුත් කරනු ලැබිය යුතු අතර, ඒ වවුචරය පිළියෙළ කරන ලද්දේ යම්කිසි තැනැත්තකු විසින්ද, නැතහොත් යම්කිසි තැනැත්තකු වෙනුවෙන්ද, ඒ තැනැත්තා විසින් ඒ වවුචරය පිළියෙළ කරනු ලැබූ කාර්තුව ඉකුත්වීමෙන් පසුව අවුරුදු පහක කාලයක් ඒ වවුචරයේ පිටපත රඳවා තබාගැනීම හා ආරක්ෂාව කිරීම කරනු ලැබිය යුතුය.

මේ වගන්තියේ කුමක් සඳහන් වුවද, විවිධ වර්ගවල හෝ විස්තරවල ව්‍යාපාර සම්බන්ධයෙන් ගනුදෙනු වාර්තාගත කරනු ලැබිය හැක්කේ යම් ආකෘතියක් හා ආකාරයක් අනුවද, ඒ ආකෘතිය හා ආකාරය එම වර්ගයේ හෝ විස්තරයේ යම් ව්‍යාපාරයක ස්වභාවය සැලකිල්ලට ගනිමින්, කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකිය. ව්‍යාපාරයක ගනුදෙනු වාර්තාගත කරනු ලැබිය යුතු ආකෘතිය හා ආකාරය කොමසාරිස්-වරයා විසින් නියම කරනු ලැබ ඇති අවස්ථාවක, පිරිවැටුම් බද්ද අයකරනු ලැබිය යුතුවූද, ඒ ව්‍යාපාරය කරගෙන යනු ලබන්නාවූද, සෑම තැනැත්තකු විසින්ම ඒ ව්‍යාපාරය කරගෙන යාමේදී තමා ඇතුළත්වූ එක් එක් හා සෑම ගණුදෙණුවක්ම නියමිත ආකෘතියෙහි සහ ආකාරයට වාර්තාගත කිරීම හෝ වාර්තාගත කිරීමට සැලැස්වීම කරනු ලැබිය යුතුය. එම වාර්තාව පිළියෙළ කරන ලද්දේ යම් තැනැත්තෙකු විසින්ද, නැතහොත් යම් තැනැත්තෙකු වෙනුවෙන්ද ඒ තැනැත්තා විසින් එම වාර්තාව පිළියෙළ කරන ලද්දේ යම් කාර්තුවක් සම්බන්ධයෙන්ද එම කාර්තුව ඉකුත්වීමෙන් පසුව අවුරුදු පහක කාලයක් රඳවා තබාගැනීම හා ආරක්ෂා කිරීම කරනු ලැබිය යුතුය.

## XI වන පරිච්ඡේදය.

## පරිපාලනය

74 (1) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පළාත් ආදායම් කොමසාරිස්-වරයෙකු පත්කරනු ලැබියයුතු අතර, අවශ්‍යවන්නාවූ නියෝජ්‍ය ආදායම් කොමසාරිස්වරුන්

පරිපාලනය.

හා ආදායම් තක්සේරුකරුවන් සහ වෙනත් නිලධරයන් සංඛ්‍යාවක් ද පත් කරනු ලැබිය හැකිය.

(2) මේ පනත යටතේ කොමසාරිස්වරයා වෙත පවරා ඇති යම් බලයක් ක්‍රියාත්මක කරන හෝ යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කරන කොමසාරිස්වරයකු හෝ නියෝජ්‍ය කොමසාරිස්වරයකු, පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක්, ඒ බලය ක්‍රියාත්මක කිරීමට හෝ ඒ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමට බලය දෙනු ලැබූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) මේ ප්‍රඥප්තිය මගින් තක්සේරුකරුවකු වෙත පවරනු ලැබූ යම් බලයක් නියෝජ්‍ය කොමසාරිස්වරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී ආදායම් කොමසාරිස්වරයා වශයෙන් හෝ නියෝජ්‍ය ආදායම් කොමසාරිස්වරයකු වශයෙන් හෝ ආදායම් තක්සේරුකරුවකු වශයෙන් ධුරය දරන සෑම තැනැත්තකුම, සියලු කාර්ය සඳහා, (1) වන උප වගන්තිය යටතේ පත් කරනු ලැබුවකු ලෙස සලකනු ලැබිය යුතු ය.

නිල රහස්‍යභාවය.

75 (1) මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමෙහි ලා හැර, මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් තැනැත්තකුට සහායවීම සඳහා හෝ සේවයෙහි නියුක්ත කරවනු ලැබ සිටින හෝ සේවයේ යොදවා ඇති සේ සලකනු ලබන සෑම තැනැත්තෙකු ම, මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී යම් තැනැත්තකුගේ කටයුතු පිළිබඳව තමාට දැන ගැනීමට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීම හා ආරක්ෂා කිරීමෙහි ලා සහායවීම කළ යුතුය. තවද, ඒ කාරණය අදාල වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට හෝ අමාත්‍යවරයාට හෝ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට හෝ හැර යම් තැනැත්තාට එවැනි යම් කාරණයක් නොදැන්විය යුතු අතර, කොමසාරිස්වරයාගේ සන්තකයෙහි භාරයෙහි හෝ පාලනයෙහි ඇති ලේඛන කිසිවක් ලබා ගැනීමට යම් තැනැත්තකුට ඉඩ හැරීම හෝ අවසර දීම හෝ නොකළ යුතුය.

(2) මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා පත් කරනු ලැබූ හෝ

සේවයෙහි නියුක්ත කරවනු ලැබූ හෝ සේවයේ යොදවා ඇති සේ සලකනු ලබන යම් තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කිරීමට පෙර සාමදාන විනිශ්චයකාරවරයෙකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යභාවය පිළිබඳ දිවුරුමක් දී එය අත්සන් කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මේ පනත යටතේ ක්‍රියා කිරීමට පෙර සාමදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී නියමිත ආකෘතියෙහි වූ රහස්‍යභාව පිළිබඳ දිවුරුමක් දී එය අත්සන් කළ හැකි ය.

(3) මේ පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා පත් කරනු ලැබූ හෝ සේවයෙහි නියුක්ත කරවනු ලැබූ හෝ සේවයේ යොදවා ඇති සේ සලකනු ලබන කිසිම තැනැත්තකුට, මේ පනතෙහි හෝ කොමසාරිස්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි හැර, මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන යම් වාර්තාවක්, ලේඛනයක් හෝ තක්සේරුවක් යම් අධිකරණයක දී ඉදිරිපත් කිරීමට හෝ යම් කාරණයක් හෝ දෙයක් යම් අධිකරණයකට හෙළිදරව් කිරීමට නැතහොත් දැක්වීමට හෝ නියම කරනු නොලැබිය යුතුය.

(4) මේ වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත් ද, මේ ප්‍රඥප්තිය යටතේ හෝ කොමසාරිස්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකුට දැන ගැනීමට ලැබෙන යම් කාරණයක්, ඔහු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතිය යටතේ ඔහුගේ යම් කාර්යයක් ඉටු කිරීම සඳහා ඒ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධරයකුට ඒ කාරණය දැනුම් දීම අවශ්‍ය නම් ඒ එවැනි යම් නිලධරයකුට දැනුම් දීම කළ හැකි අතර, ලේඛන ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනතේ කුමක් සඳහන්ව ඇත ද මේ ප්‍රඥප්තිය යටතේ හෝ කොමසාරිස්වරයා විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ කොමසාරිස්වරයා වෙත සපයනු ලැබූ හෝ අන්‍යකාරණයකින් ඔහු සන්තකයෙහි ඇති යම් වාර්තාවක හෝ ලේඛනයක සඳහන් යම් විස්තර වල

පිටපතක් ඒ විස්තර වල සත්‍ය පිටපතක් ලෙස ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් සහතික කරනු ලැබ, මේ ප්‍රඥප්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකිය. එවැනි අවස්ථාවක දී, ලේඛන ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනතේ කුමක් සඳහන්ව ඇත ද, ඒ ලේඛනය සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතුය.

එසේ වුවද, එවැනි යම් වාර්තාවක් හෝ ලේඛනයක් ලියූ, සෑදූ අත්සන් කළ හෝ සැපයූ තැනැත්තාගේ අත් අකුරු හෝ අත්සන ඔප්පු කිරීමට අවශ්‍ය වන හෝ විටක එසේ ඔප්පු කිරීමේ කාර්ය සඳහා පමණක්, ඒ වාර්තාවේ හෝ ලේඛනයේ මුල් පිටපත කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම හෝ කළ හැකිය.

එසේම තවදුරටත්, එවැනි ලේඛනයක හෝ වාර්තාවක මුල් පිටපත හෝ එවැනි ලේඛනයක හෝ වාර්තාවක සඳහන් යම් විස්තරවල පිටපතක් හෝ අධිකරණයකට ඉදිරිපත් කිරීමට කවර හෝ විටක දී කොමසාරිස්වරයාට බල කරනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද –

(1) 1989 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරනු ලැබූ කොමිෂන් සභාවක් විසින් යම් තැනැත්තකුගේ, ඔහුගේ කලත්‍රයාගේ, ඔහුගේ පුත්‍රයකුගේ හෝ දියණියකගේ නැතහොත් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් තැනැත්තකුගේ චර්යාව පිළිබඳව පරීක්ෂා කිරීමක දී ඒ තැනැත්තාගේ කටයුතු සම්බන්ධයෙන් කොමසාරිස්වරයාට ලබා ගත හැකි සියලු තොරතුරු සපයන ලෙස කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ දැන්වීමක් මගින් නියම කරනු ලැබුවහොත්, අවස්ථාවෝචිත පරිදි ඒ දැන්වීමෙහි සඳහන් තැනැත්තාට, ඔහුගේ කලත්‍රයාට, පුත්‍රයාට දියණියට හෝ ඒ වෙනත් යම් තැනැත්තාට අදාළව කොමසාරිස් වරයාගේ සන්තකයෙහි නැතහොත් පාලනය යටතේ ඇති සියලු තොරතුරු සැපයීම සහ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ සැපයීම කොමසාරිස්වරයා විසින් කරනු ලැබිය යුතුය.

(ii) යම් තැනැත්තෙකුට එරෙහිව හසා ඇති අල්ලස් චෝදනාවක් විමර්ශනය කිරීමේ දී හෝ අල්ලස් ගැනීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩුවක් පැවරීමෙන් පසුව හෝ ඒ තැනැත්තා විනිශ්චයක් සඳහා ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව හෝ නීතිපතිවරයා විසින් දැන්වීමක් මගින් නියම කරනු ලැබුවහොත් ඒ තැනැත්තාගේ, ඔහුගේ කලත්‍රයාගේ, පුත්‍රයාගේ හෝ දියණියගේ කටයුතුවලට අදාලව කොමසාරිස්වරයා වෙත ඇත්තා වූ ද එකී දැන්වීමෙහි සඳහන් කොට ඇත්තා වූ ද සියලු තොරතුරු සහ ඒ තැනැත්තාට, ඔහුගේ කලත්‍රයාට, පුත්‍රයාට හෝ දියණියට අදාළව තමා සන්තකයේ ඇති හෝ තම පාලනය යටතේ ඇති යම් ලේඛනයක් නැතහොත් යම් ලේඛනයක සහතික කළ පිටපතක් ද කොමසාරිස්වරයා විසින් නීතිපතිවරයා වෙත සැපයිය යුතුය.

(iii) පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරනු ලද කොමිෂන් සභාවක් දැන්වීමක් මගින් නියම කරනු ලැබුවහොත්, ඒ කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුගේ, ඔහුගේ කලත්‍රයාගේ, පුත්‍රයාගේ හෝ දියණියගේ චර්යාව සම්බන්ධයෙන් පරීක්ෂා කර ගෙන යනු ලැබේ ද ඒ තැනැත්තාගේ කටයුතු පිළිබඳව කොමසාරිස්වරයා වෙත ඇති සියලු තොරතුරු ද එකී දැන්වීමේ සඳහන් පරිදි ඒ තැනැත්තාට, ඔහුගේ කලත්‍රයාට, පුත්‍රයාට, හෝ දියණියට අදාළ වූ ද කොමසාරිස්වරයාගේ සන්තකයේ නැතහොත් ඔහුගේ පාලනය යටතේ ඇත්තා වූ ද යම් ලේඛනයක් හෝ ලේඛනයක සහතික කළ පිටපතක් ද කොමසාරිස්වරයා විසින් ඒ පරීක්ෂණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු ය. නැතහොත් සැපයිය යුතු ය.

(iv) කොමසාරිස්වරයාට ලැබී ඇති තොරතුරු අනුව යම් තැනැත්තකු අල්ලස් ගැනීමේ වරදක් කර ඇති බව කොමසාරිස්වරයා සැක කරන අවස්ථාවක දී එවැනි කරුණක් ගැන විමර්ශනය කිරීම සඳහා එය නීතිපතිවරයා වෙත වාර්තා කළ යුතුය.

(6) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ, පිහිටවනු ලැබූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිනු ලැබූ විටක, ඒ පනත යටතේ ඒ කොමිෂන් සභාවේ ඵලදායී ක්‍රියාත්මක කිරීම සහ එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා යම් තැනැත්තකු සම්බන්ධයෙන් ඒ කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිනු ලබන්නා වූ ද මේ ප්‍රඥප්තිය යටතේ තම කාර්ය ඉටු කිරීමේ දී කොමසාරිස්වරයාට දැනගන්නට ලැබී ඇත්තා වූ ද විස්තර, කොමසාරිස්වරයා විසින් ඒ කොමිෂන් සභාව වෙත අනාවරණය කළ යුතුය.

(7) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, විගණකාධිපතිවරයාගේ නිල කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍යවන පොත්, වාර්තා, වාර වාර්තා හෝ වෙනත් ලේඛන පරීක්ෂා කිරීමට විගණකාධිපතිවරයාට හෝ ඔහු විසින් ඒ කාර්යය සඳහා යථා පරිදි බලය දෙනු ලැබූ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධරයකුට අවසර දීම කොමසාරිස්වරයා විසින් කරනු ලැබිය හැකිය. විගණකාධිපතිවරයා හෝ මේ වගන්තිය යටතේ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකුට, (2) වන වගන්තියේ කාර්ය සඳහා, මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස සේවයේ යොදවනු ලැබූ තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල කුමක් සඳහන් වුවද, කොමසාරිස්වරයා විසින් හෝ, ඒ කාර්යය සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින්, උචිතයයි සලකනු ලබන අවස්ථාවක දී –

(අ) සියලුම බදු ගෙවන්නන්ගේ නම් හා ලිපිනයන් සහ යම් තක්සේරු වර්ෂයක් සඳහා එබඳු ගෙවන්නන් විසින් සපයනු ලැබූ වාර්තාවල ප්‍රකාශ කොට ඇති මුළු ආදායම සහ අවශ්‍යයයි කොමසාරිස්වරයා සලකනු ලබන විට ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ග කවරේදැයි යන්නද අඩංගු ලැයිස්තුවක් ; සහ

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ යම් වරදකට යම් අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබූ හෝ මේ ප්‍රඥප්තිය යටතේ කොමසාරිස්වරයා විසින් දණ්ඩනයක් පනවනු ලැබූ යම් තැනැත්තකුට අදාළ තොරතුරු

කොමසාරිස්වරයා විසින් සුදුසුයයි සලකනු ලබන ආකාරයට කලින් කල ප්‍රසිද්ධ කිරීමට කටයුතු සලස්වනු ලැබිය හැකිය.

(9) යම් රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද රක්ෂණ ඔප්පු දරන්නන්ගේ අභිලාෂයට අහිතකර ආකාරයට ක්‍රියා කොට ඇති ඒ ව්‍යාපාරයේ යම් අධ්‍යක්ෂවරයෙකුට, කළමනාකරුවකුට හෝ වෙනත් නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව නඩු පැවරීමේ කාර්යය සඳහා ඒ අධ්‍යක්ෂවරයාගේ, කළමනාකරුගේ නිලධරයාගේ හෝ සේවකයාගේ වත්කම් වලට අදාළව කොමසාරිස්වරයාගේ සන්තකයෙහි ඇති තොරතුරු විස්තර සපයන ලෙස නීතිපතිවරයා විසින් කොමසාරිස්වරයාට ලිඛිත නිවේදනයක් මගින් නියම කරනු ලැබූ විටක, කොමසාරිස්වරයා විසින් ඒ තොරතුරු නීතිපති වරයා වෙත සැපයිය යුතුය.

(10) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, යම් තැනැත්තකු විසින් විනිමය පාලන පනත හෝ දේශීය ආදායම් පනත හෝ යටතේ යම් වරදක් සිදු කොට ඇති බව, මේ ප්‍රඥප්තිය යටතේ කොමසාරිස්වරයාගේ කාර්ය ඉටු කිරීමේ දී ඔහුට දැන ගන්නට ලැබෙන යම් කරුණකින් ඔහුට පෙනී යන අවස්ථාවක දී, ඒ වරද සිදු කිරීම හා සම්බන්ධ යම් තොරතුරක් හෝ ඒ වරද සිදු කළ බව ඔප්පු කිරීමේ දී අවශ්‍ය වන හෝ ප්‍රයෝජනවත් වන ගිණුම් පොත් හෝ වෙනත් ලේඛන අවස්ථාවෝචිත පරිදි, විනිමය පාලක වෙත හෝ ප්‍රධාන දේශීය ආදායම් වෙත කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ යුතුය.

(11) විනිමය පාලන පනත යටතේ හෝ දේශීය ආදායම් පනත යටතේ යම් තැනැත්තකු විසින් සිදු කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් අදාළ වන යම් තොරතුරක් හෝ ඒ වරද සිදු කොට ඇති බව ඔප්පු කිරීමට අවශ්‍ය වන හෝ ප්‍රයෝජනවත් වන යම් ගොනු, ගිණුම් පොත් හෝ වෙනත් ලේඛන, කොමසාරිස්වරයා විසින් (10) වන උපවගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, විනිමය පාලක හෝ ප්‍රධාන දේශීය ආදායම් වෙත සපයන ලද හෝ භාර දෙන ලද අවස්ථාවක දී, මේ වගන්තියේ ඉහත විධිවිධානවල ප්‍රතිවිරුද්ධව කුමක් සඳහන්ව ඇතද, ඒ වරද සිදු කිරීම සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව පවරනු ලබන යම් නඩු විභාගයක දී, කොමසාරිස්වරයා විසින් හෝ ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනත් යම් නිලධරයකු විසින් ඒ නඩුවේ දී එකී තොරතුරුවලට, ගොනු වලට, ගිණුම් පොත් වලට හෝ වෙනත්

ලේඛණවලට අදාළව සාක්ෂි දිය හැකි අතර, ඉදිරිපත් කිරීමට තමාට නියම කරනු ලබන වාර වාර්තා, ගිණුම් පොත්, වෙනත් ලේඛණ හෝ භාණ්ඩ ඉදිරිපත් කිරීම නැතහොත් ඉදිරිපත් කිරීමට සැලැස්වීම කරනු ලැබිය හැකිය. එවැනි නඩුවක කටයුතු සඳහා , යම් වාර්තාවක, ගිණුම් පොතක හෝ වෙනත් ලේඛණයක අඩංගු විස්තරවල පිටපතක් කොමසාරිස්වරයා විසින් හෝ ඒ වෙනත් නිලධරයා විසින් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, ලේඛණ ඔප්පු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනතේ කුමක් සඳහන්ව ඇතද, ඒ පිටපත සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතුය.

(අ) ඒ වාර්තාව , ගිණුම් පොත් හෝ වෙනත් ලේඛණ ලියූ, සැදූ අත්සන් කළ හෝ සැපයූ තැනැත්තාගේ අත්අකුරු නැතහොත් අත්සන ඔප්පු කිරීම සඳහා අවශ්‍ය වන විටෙක සහ එවැනි ඔප්පු කිරීමක් සඳහාම පමණක් එකී වාර්තාවල, ගිණුම් පොත්වල හෝ වෙනත් ලේඛණවල මුල් පිටපත් ඉදිරිපත් කිරීම හෝ ඉදිරිපත් කිරීමට සැලැස්වීම කොමසාරිස්වරයා විසින් හෝ වෙනත් නිලධාරියා විසින් කරනු ලැබිය හැකිය ;

(ආ) එවැනි යම් වාර්තාවක, ගිණුම් පොතක හෝ වෙනත් ලේඛණයක මු ල් පිටපත නැතහොත් එවැනි වාර්තාවක, ගිණුම්පොතක හෝ වෙනත් ලේඛණයක අඩංගු විස්තරවල පිටපතක් අධිකරණයට ඉදිරිපත් කරන ලෙස කවර අවස්ථාවකදී වුවද, කොමසාරි ස්වරයාට හෝ ඒ වෙනත් නිලධරයාට බලකරනු නොලැබිය යුතුය.

76. (1) මෙහි මින් මතු " අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන, ආදායම් පෙළඹවීම් අරමුදල නැමැති අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) අරමුදලේ කාර්ය සඳහා පළාත්සභාව විසින් වාර්ෂිකව අයකරගනු ලබන මුදල් ප්‍රමාණයක් එක් එක් වර්ෂය සඳහා ඒ වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට හෝ පසුව ගෙවනු ලැබිය යුතුය.

(3) එකී අරමුදලෙන් පහත දැක්වෙන ගෙවීම් කරනු ලැබිය යුතුය :-

(අ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුභ සාධනය සඳහා අවශ්‍ය යන සියලු මුදල් ප්‍රමාණ;

(ආ) කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබන යම් ප්‍රඥප්තියක් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහතික කරනු වස් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව, ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයන් පන්තියකට හෝ වර්ගයකට සාමූහික පෙළඹවීම් දීමනා.

(4) කොමසාරිස්වරයා විසින් හෝ, ඒ කාර්යය සඳහා ඔහු විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් නියමිත පරිපාටියට අනුකූලව, ඒ අරමුදල පරිපාලනය කළ යුතු ය.

## X11 වන පරිච්ඡේදය

### සාමාන්‍ය කරුණු

77. මේ ප්‍රඥප්තියේ මූලධර්ම සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ ඵලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන කරුණු සම්බන්ධයෙන් සහ විශේෂයෙන්ම, තොග හෝ සිල්ලර වෙළඳාම් මත පිරිවැටුම් බද්ද සම්බන්ධයෙන් වන විට වෙළඳාම පිළිබඳ ඇස්තමේන්තුවක් සකස් කළ යුතු ආකාරය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

78. යම් කාර්තුවක් සඳහා යම් තැනැත්තකුගෙන් නියමිත පරිදි අයකර ගනු ලැබිය යුතු පිරිවැටුම් බදු ප්‍රමාණයට වැඩි ප්‍රමාණයක් ඒ තැනැත්තා විසින් ඒ කාර්තුව සඳහා ගෙවා ඇති බව ඒ කාර්තුව අවසාන වීමෙන් පසු වර්ෂ තුනක් ඇතුළත දී ලිඛිතව ඉදිරිපත් කරනු ලබන හිමිකම් පෑමක් මගින් ඒ තැනැත්තා විසින් කොමසාරිස්වරයා සෑහීමකට පත් වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, එසේ වැඩිපුර ගෙවන ලද මුදල්

ප්‍රමාණය ආපසු ලබා ගැනීමේ හිමිකම් ඒ තැනැත්තාට ඇත්තේය.

එසේ වුවද, අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා වූ කාලය දීර්ඝ කිරීම හෝ අඩු කිරීම හෝ, අධ්‍යක්ෂවරයෙන් අවලංගු වන්නා වූ යම් විරෝධතාවක් හෝ අභියාචනයෙන් වලංගු භාවයට පත් කිරීම හෝ අවසානාත්මකව තීරණය කරන ලද යම් තක්සේරුවක් හෝ තීරණයක් ප්‍රතිශෝධනය කිරීමට බලය දීම හෝ මේ වගන්තියේ අඩංගු කිසිවක් මගින් සිදු නොවෙයි.

## XIII වන පරිච්ඡේදය

## වැරදි සහ දඬුවම

රහස්‍යභාවය කඩකිරීම හා වෙනත් කාරණා වැරදි වන බව

79. පහත දැක්වෙන දේවල්, එනම් -

(අ) 75 වන වගන්තිය යටතේ රහස්‍යභාව පිළිබඳ දිවුරුම් දීමට නියමිත තැනැත්තකුව සිටිය දී එම දිවුරුම නොදී මේ ප්‍රඥප්තිය යටතේ කටයුතු කරන්නාවූ ; හෝ

(ආ) 76 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් කටයුතු කරන්නා වූ ; හෝ

(ඇ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන වලින් කිසිවක් කඩ කරමින් කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකුට ආධාර දෙන්නා වූ අනුබල දෙන්නා වූ හෝ වෙනත් යම් තැනැත්තකු පොළඹවන්නා වූ ; හෝ

සෑම තැනැත්තකුම මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරියේදී පැවැත්වෙන ( සු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

වංචා සම්බන්ධයෙන් දණ්ඩන විධිවිධාන

80. පහත දැක්වෙන දේවල්, එනම් -

(අ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව අයත් ලැබූ යම් ප්‍රතිලාභයකට හෝ

නොරතුරු සපයන ලෙසකරනු ලැබූ ඉල්ලීමකට හෝ වාචිකව හෝ ලියවිල්ලක් මාර්ගයෙන් හෝ යම් අසත්‍ය පිළිතුරක් දෙන්නා වූ ; හෝ

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ සපයනු ලැබූ හෝ ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවක තමා විසින් ඇතුළත් කළ යුතුව තිබුණු යම් විස්තර ඒ වාර්තාවෙහි ඇතුළත් නොකර අත් හරින්නාවූ ;

(ඇ) මේ ප්‍රඥප්තිය යටතේ යම් අසත්‍ය වාර්තාවක් කරන්නා වූ හෝ මේ ප්‍රඥප්තිය යටතේ සපයනු ලබන යම් වාර්තාවක යම් අසත්‍ය සටහනක් කරන්නා වූ

සහ එමගින් පිරිවැලුම් බද්ද ගෙවීම මග හරින්නාවූ හෝ මඟ හැරීමට තැත් කරන්නා වූ හෝ ඒ බද්ද ගෙවීම මග හැරීමට හෝ මග හැරීමට තැත් කිරීමට වෙනත් තැනැත්තකුට උපකාර කරන්නා වූ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත් වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට –

(1) වරද කරනු ලැබුවේ යම් කාර්තුවක් සම්බන්ධයෙන් ද නැතහොත් ඇතුළත් ද ඒ කාර්තුව සඳහා අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා හෝ එසේ සහාය දෙනු ලැබූ අන් තැනැත්තා හෝ මේ පනත යටතේ ගෙවීමට යටත්ව සිටින්නා වූ ද මග හැරියා වූ හෝ මග හැරීමට තැත් කළා වූ ද බදු මුදල් ප්‍රමාණය මෙන් දෙගුණයකට සමාන මුදලකින් ; සහ

(11) රුපියල් පන්දහසක් නොඉක්මවන මුදලකින්

සමන්විත දඩයක් ගෙවීමට හෝ මාස හයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර/ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතුය.

වාර්තා ආදියට අදාළ දණ්ඩන විධිවිධාන.

81. (අ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ ; හෝ

(ආ) 38 වන වගන්තිය හෝ 45 වන වගන්තිය යටතේ තමාට නිකුත් කරන ලද දැන්වීමක නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ ;

(ඇ) 38 වන වගන්තිය හෝ 45 වන වගන්තිය යටතේ තමාට නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයකු ඉදිරියේ පෙනී සිට, ඒ නිලධරයා විසින් නීත්‍යානුකූලව තමාගෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින්නා වූ ; හෝ

(ඈ) පිරිවැටුම් බද්දට තමා යටත් වීම හෝ වෙනත් යම් තැනැත්තකු යටත් වීම කෙරෙහි බලපාන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් යම් සාවද්‍ය තොරතුරක් සපයන්නා වූ ; හෝ

(ඉ) 71 වන වගන්තිය හෝ 72 වන වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමසාරිස්වරයාට හෝ වෙනත් යම් නිලධරයකුට හිතාමතාම බාධා කරන්නා වූ හෝ කොමසාරිස්වරයා හෝ වෙනත් යම් නිලධරයකු ප්‍රමාද කරන්නා වූ ; හෝ

(ඊ) මේ පනතේ විධිවිධාන වලට විරුද්ධව කටයුතු කිරීමට වෙනයම් තැනැත්තකුට ආධාර දෙන්නා වූ, අනුබල දෙන්නා වූ හෝ වෙනත් යම් තැනැත්තකු පොළඹවන්නා වූ

සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට 9 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක නියමයන් අනුව කටයුතු කිරීම පැහැර හැරීමේ වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පස් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දහයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම සහ වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් පන් දහසක් නොඉක්මවන

දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකට හෝ ඔහු යටත් විය යුතු ය.

වැරදි සමථයට පත් කිරීම.

82. 79 වන වගන්තිය 80 වන වගන්තිය හෝ 81 වන වගන්තිය යටතේ වූ යම් වරදක් කොමසාරිස්වරයා විසින් සමථයට පත් කළ හැකිය. තවද, ඒ යටතේ වූ යම් නඩු කටයුත්තක් නඩු තීන්දුවට පෙර නතර කිරීම හෝ සමථයකට පත් කිරීම ඔහු විසින් කළ හැකිය.

මේ ප්‍රඥප්තියේ විධිවිධාන බල පැවැත්විය යුතු බව.

මේ ප්‍රඥප්තියේ සහ වෙනත් යම් නීතිගත විධිවිධාන අතර අනනුකූලතාවක් ඇති වුවහොත් එම අනෙක් නීතියේ විධිවිධාන අභිබවා ඒ ප්‍රඥප්තියේ විධිවිධාන බල පැවැත්විය යුතුය.

## අර්ථ නිරූපනය

අර්ථ නිරූපනය.

84. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියේ -

"අනුයෝජිතයා" යන්නට වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් ව්‍යාපාරයක මෙහෙයවීම, පාලනය හෝ කළමනාකරණය කරමින් සිටින තැනැත්තකු අදහස් වේ.

"භාණ්ඩය" යන්නට යම් ඖෂධ ද්‍රව්‍ය හෝ යම් කෘමිනාශක හෝ රසායන නිෂ්පාදන ඇතුළත් වේ.;

"තක්සේරුකරු" යන්නෙන් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරන ලද ආදායම් තක්සේරුකරුවකු අදහස් වන අතර, මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරන ලද ආදායම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු ද ඊට ඇතුළත් වේ.

"බලයලත් නියෝජිතයා" යන්නෙන් -

(අ) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා යම් තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා

කිරීමට ඒ තැනැත්තා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබුවා වූ ද

(ඇ) කවර අවස්ථාවක දී වුව ද –

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු වන්නා වූ ද,

(ii) කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබූ ගණකාධිකාරිවරයකු වන්නා වූ,

(iii) නීතිඥවරයකු වන්නා වූ හෝ

(iv) අදාළ තැනැත්තා විසින් නිත්‍යයක සේවයෙහි නියුක්ත කරනු ලැබූ සේවා නියුක්තයකු වන්නා වූ,

(ඈ) පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට ඔහුගේ ඥාතියෙකු වන්නා වූ ද,

(ඉ) සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ සමාගමේ අධ්‍යක්ෂවරයකු හෝ ලේකම්වරයකු වන්නා වූ ද,

(ඊ) හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට, ඒ හවුල් ව්‍යාපාරයේ හවුල් කරුවකු වන්නා වූ ද,

(උ) පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන්නා වූ ද, නැතහොත්

(2) බලය දීමට අදාළ යම් කාරණා සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා තමා වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස තැනැත්තකු විසින් කලින් කල ලියවිල්ලකින් බලය දෙනු ලැබුවා වූ ද මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද

යම් පුද්ගලයෙක් අදහස් වේ;

"පුද්ගල මණ්ඩලය" යන්නෙන් සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද යම් මණ්ඩලයක්, පළාත් පාලන ආයතනයක්, යම් සහෝදරත්වයක්,

මිශ්‍ර සංගමයක් , සංගමයක් හෝ සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද තැනැත්තන්ගේ සමිතියක්, යම් හවුල් ව්‍යාපාරයක් යන මේ ඒකාබද්ධ තීන්දු පවුලක් අදහස් වන අතර, යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් ව්‍යාපාරයක් ඊට ඇතුළත් වේ;

"ව්‍යාපාරය" යන්නට යම් කර්මාන්තයක්, වෘත්තියක්, රැකියාවක් , කෘෂිකාර්මික ව්‍යාපාරයක් තුරඟ තරඟ පැවැත්වීම හෝ සමාගමක් විසින් වාණිජ ස්ථාන කුලියට දීම හෝ සාදන්නකුගේ ව්‍යාපාරයක් හෝ යම් ගණුදෙණුවක් හෝ කරන ලද සේවාවක් වෙනුවෙන් කොමිස් හෝ ගාස්තුවක් අයකරගන්නාවූ යම් තැනැත්තකුගේ ව්‍යාපාරයක් හෝ ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකුගේ ව්‍යාපාරයක් හෝ වෙළඳ ස්වභාවය ඇති සෑම ප්‍රයත්නයක් සහ ආයතනයන්ද ඇතුළත් වේ.

"කොමසාරිස්වරයා" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ පත්කරනු ලැබූ ආදායම් කොමසාරිස්වරයා අදහස් වන අතර, කොමසාරිස්වරයා වෙනුවෙන් සාමාන්‍යයෙන් හෝ යම් විශේෂ කාර්යයන් සඳහා හෝ ක්‍රියා කිරීමට ඔහු විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු ඊට ඇතුළත් වේ ;

"සමාගම" යන්නෙන් ශ්‍රී ලංකාවේ හෝ අන්කිසි තැනක හෝ බලපවත්නා යම් නීතියක් යටතේ සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබ යම් සමාගමක් අදහස් වන අතර, රාජ්‍ය සංස්ථාවන්ද ඊට ඇතුළත් වේ.

"නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන්නෙන් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත්කරනු ලැබූ ආදායම් නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු අදහස් වේ. ;

"බැහැර කරනලද භාණ්ඩය" යන්නෙන් 08 වන වගන්තිය යටතේ බැහැර කරන ලද භාණ්ඩයක් වශයෙන් ප්‍රකාශයට පත්කරන ලද යම් භාණ්ඩයක් අදහස් වේ ;

"පොල්මංකරු" යන්නෙන් මියගිය තැනැත්තකුගේ පොල්මංකරු හෝ අද්මිනිස්ත්‍රාධිකරු අදහස් වන අතර ,

(ඇ) මියගිය තැනැත්තකුගේ දේපලවල සන්තකය ලබාගත්තා හෝ ඒ සම්බන්ධයෙන් මැදිහත්වන යම් තැනැත්තකු ; හෝ

(ආ) මියගිය තැනැත්තකුගේ මුදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ තැවත මුද්‍රා තැබීම සඳහා දිසා අධිකරණයට ඉල්ලුම්කර ඇති හෝ ඉල්ලුම් කිරීමට හිමිකම් ඇති යම් තැනැත්තකු ඊට ඇතුළත් වේ.

"තැනැත්තා" යන්නට සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් ඊට ඇතුළත් වේ.

"ප්‍රමුඛ හවුල්කරු" යන්නෙන් ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින සක්‍රිය හවුල්කරුවන් අතුරෙන් -

(අ) හවුල් ව්‍යාපාර ගිවිසුමේ පළමුවෙන් නම් කොට ඇති ; හෝ ,

(ආ) එවැනි ගිවිසුමක් නොමැති නම්, හවුල් ව්‍යාපාර හෝ සාමාන්‍ය නාමයෙන් තනිවම හෝ අනික් හවුල්කරුවන්ට ප්‍රමුඛව තමන් හෝ මුලකුරුවලින් සඳහන් කොට ඇති ; හෝ

(ඇ) ව්‍යාපාර නාම ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ කරනු ලැබූ ප්‍රකාශයෙහි පළමුවෙන් නම්කොට ඇති හවුල්කරු අදහස් වේ ;

"කාර්තුව" යන්නෙන් සෑම අවුරුද්දකම ජනවාරි මාසයේ පළමුවන දිනයෙන්, අප්‍රේල් මාසයේ පළමුවන දිනයෙන්, ජූලි මාසයේ පළමුවන දිනයෙන් සහ ඔක්තෝම්බර් මාසයේ පළමුවන දිනයෙන් ආරම්භ වන මාස තුනක කාලය අදහස් වේ.

"භාරකරු" යන්නට යම් භාරකරුවෙකු, ආරක්ෂකයකු, දේපළ ආරක්ෂකයකු, කළමනාකරුවකු, අනුයෝජිතයකු හෝ යම් තැනැත්තකු වෙනුවෙන් යම් දේපළක සංවිධානය, පාලනය හෝ කළමනාකරණය සතුව ඇති වෙනත් තැනැත්තකු ඇතුළත් වන නමුත් පොල්මකරුවෙකු ඊට ඇතුළත් නොවේ.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල පාඨය බල පැවැත්විය යුතු බව

85. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.